
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

கொழும்புப் பல்கலைக்கழகத்தின் கணினிக் கல்விக் கல்லூரி

UNIVERSITY OF COLOMBO SCHOOL OF COMPUTING




# 2015


වාර්ෂික වාර්තාව


ஆண்டறிக்கை

# Annual Report



# වාර්ෂික වාර්තාව 2015





කොළඹ විශ්වවිද්‍යාලයීය

පරිගණක අධ්‍යයනායතනය

# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## පටුන


දැක්ම සහ මෙහෙවර ........................................................................... 01

අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය ........................................................................... 02

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සංක්ෂිප්ත සටහන ........................................ 03
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය හැඳින්වීම ........................................ 05

පාලනය ........................................................................... 06

අධ්‍යාපනය ........................................................................... 08
වැඩසටහන් සහ සිසුන් ........................................................................... 08
ප්‍රථම උපාධි අධ්‍යාපනය ........................................................................... 08
පශ්චාත් උපාධි අධ්‍යාපනය ........................................................................... 14
බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා ........................................................................... 15
විදේශ සිසුන් ........................................................................... 18
ආරම්භ කරන ලද නව පාඨමාලා ........................................................................... 18

පර්යේෂණ ........................................................................... 19
පර්යේෂණ, නවෝත්පාදන සහ ........................................................................... 19
ප්‍රකාශන
සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළු ........................................................................... 20
ලබා ගත් සම්මාන ........................................................................... 21

අධ්‍යයන කාර්ය මණ්ඩලය ........................................................................... 21
අනධ්‍යයන කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත් /පැවරුම් (C/A) ........................................ 22

මූල්‍ය ........................................................................... 23
පුනරාවර්තන වියදම් ........................................................................... 23
ප්‍රාග්ධන වියදම් ........................................................................... 23
ව්‍යාපෘති ( දේශීය/ විදේශ අරමුදල්) ........................................................................... 24
ව්‍යාපෘති වියදම (දේශීය/ විදේශ අරමුදල්) ........................................................................... 25
මූල්‍ය ප්‍රගතිය (වියදම) ........................................................................... 26
මූල්‍ය ප්‍රගතිය ( උපදවා ගත් ආදායම්) ........................................................................... 26
මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය ........................................................................... 26

2015 දී ලද යටිතල පහසුකම් ........................................................................... 26
මෙම වාර්තාවට අදාළ වෙනත් තොරතුරු / කාර්යසාධනය ........................................ 27

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ........................................................................... 28
2015


i පිටුව

# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## 2015 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ ගිණුම්

### දැක්ම සහ මෙහෙවර

---

### දැක්ම

ඉගෙනුම හා පර්යේෂණ තුළින් නව දැනුමේ සීමා මායිම් අභික්‍රමණය කරමින් පරිගණනයෙහි ගෝලීය නායකයකු බවට පත්වීම.

### මෙහෙවර ප්‍රකාශය

ගෝලීය ක්‍රමෝපාය සබඳතා පෝෂා කරමින්, මුහුම් ක්ෂේත්‍ර පර්යේෂණ ප්‍රවර්ධනය කරමින් අප රට කලාපයේ දැනුමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීමට දායක වන ව්‍යවසායික කුසලතා, නායකත්ව ගුණාංග සහ අවංකත්වයෙන් යුත් සමාජ වගකීමක් ඇති වෘත්තිකයන් බිහි කරමින් පරිගණන දැනුම ප්‍රගමනය සහ වැඩි දියුණු කිරීම.

### ඉලක්ක

1. පරිගණනනයේ ඉගැන්වීම් සහ ඉගෙනුමෙහි විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම
2. පරිගණනයෙහි සීමා මායිම් විස්තාරණය කිරීමට සහ මුහුම් ක්ෂේත්‍ර පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
3. ව්‍යවසායික කුසලතා, නායකත්ව ගුණාංග සහ අවංකත්වයෙන් යුත් සමාජ වගකීමක් ඇති වෘත්තිකයන් බිහි කිරීම
4. ඵලදායී සේවය සහ වෘත්තිය වැඩිදියුණුව සඳහා සහෝපකාරී පරිසරයක් ස්ථාපනය සහ පවත්වාගෙන යාම
5. ආයතනික ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම
6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය තුළින් සමාජය බල ගැන්වීම
7. රට දැනුමෙහි කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා සුවිශේෂ දායකත්වයක් ලබා දීම සහ වෘත්තීය සේවා සම්පාදනය

## අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

පරිගණනයෙහි උසස් ඉගෙනුම් මධ්‍යස්ථානයක් වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ක්ෂේත්‍රයේ නවීනතම සංවර්ධනයන් සමඟ ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමේ සිසුන් මෙන්ම තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ නිරතව සිටින්නන් ද පුහුණු කිරීමේ කාර්යයයෙහි නිරතව සිටියි. සංශෝධිත විෂය මාලාව පදනම් කරගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා පිරිනමනු ලබන උපාධි පාඨමාලා හතරක් සඳහා අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් 770ක් බඳවාගෙන ඇත. තවද අදාළ විද්‍යාත්මක විෂයපථවල තොරතුරු තාක්ෂණ භාවිතය පිළිබඳව විද්‍යා උපාධිධාරීන් 997දෙනෙකු පුහුණු කරන ලද අතර සිසුන් 1,890ක් සඳහා බාහිරව තොරතුරු තාක්ෂණ උපාධිය හැදෑරීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී. සිසුන් 452ක් පශ්චාත් උපාධිය සඳහා පුහුණු කරන ලද අතර 51දෙනෙකු පර්යේෂණ උපාධි සඳහා ඇතුළත් වන ලදී. පෙර වර්ෂවල ඇතුළත් වූ සිසුන් අතරින් 227දෙනෙකු ප්‍රථම උපාධි මට්ටමේ උපාධි ද එක් දර්ශන විශාරද උපාධිධාරියකු සහ දර්ශනපති උපාධිධාරීන් තිදෙනකු ඇතුළත්ව 121 දෙනෙකු පශ්චාත් උපාධි මට්ටමේ උපාධි ද සම්පූර්ණ කරන ලදී.

අනුපිළිවෙලින් මිලියන 95 ක සහ 70ක අදායමක් සඳහා දායක වූ පශ්චාත් උපාධි සහ තොරතුරු තාක්ෂණ බාහිර උපාධිය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ප්‍රධාන අදායම් ප්‍රභව දෙක විය. ගොඩනැගිලි ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 100ක් ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පොරොන්දු වුවද මෙම මුදල වෙන් කර නොමැත. කෙසේ නමුත්, ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මෙම මුදල උත්පාදිත ආදායමෙන් ආයෝජනය කරන ලද අතර රු.මි.82ක් වැය කරන ලදී. කාර්යයන් දෙකම සඳහා රජයේ ප්‍රදානය රු.මිලියන 45ක් පමණක් වූ බැවින් රු.මි.20ක් උපකරණ සඳහා වැය කරන ලදී. විදේශ සම්මන්ත්‍රණ සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වය උදෙසා රු.මි.6.1ක් ද කාර්ය මණ්ඩල රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රු.මි. 5ක් ද ශිෂ්‍ය ආපදා අරමුදල සඳහා රු.මි. 4.1ක් ද කාර්ය මණ්ඩල ශුභසාධනය සඳහා රු. මි. 5ක් ද කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් දායක කරන ලදී.

අනෙකුත් පුහුණු ආයතනවලට වඩා විශේෂ වීම සඳහා පර්යේෂණ තුළින් නව දැනුම ඇති කිරීම කෙරෙහි කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය වැඩි අවධානයක් යොමු කරයි. කාර්ය මණ්ඩලය සම්මේලන සහ සඟරා 64ක ලිපි පළ කර ඇත. යුරෝපා සංගම් මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීම, කෘෂිකර්ම සහ ඇඟිලි සලකුණු විසඳුම ඇතුළත්ව ජාතික ගැටලු විසඳීම සඳහා ද කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ දායකත්වය පිළිබඳ ඇතැම් ධනාත්මක අදහස් සඳහන් කිරීම දිරිමත් කරවයි. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය රජයේ අමාත්‍යාංශ සහ වෙනත් ආයතන සඳහා උපදේශන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ප්‍රධාන සම්මාන 8ක් දිනා ගැනීම මඟින් කාර්ය මණ්ඩලය සහ සිසුන් ජාතික සහ ජාත්‍යන්තර මට්ටම්වලදී සාර්ථකත්වයක් ලබා ගෙන ඇත. සමාජයට ඔවුන්ගේ දායකත්වය වශයෙන් කාර්ය මණ්ඩලය බොහෝ බාහිර කමිටු, මණ්ඩල සහ වෘත්තීය සංවිධානවලට දායකත්වය දක්වන ලද අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්, පාසල් ළමුන් ඉලක්ක කරගත් තොරතුරු තාක්ෂණ වැඩසටහන් ග්‍රාමීය පළාත්වල ක්‍රියාත්මක කරන ලදී.

විසිඑක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය හරහා බාහිර උපාධි සඳහා සහ පර්යේෂණ වාණිජ්‍යකරණය සඳහා යෝජිත කටයුතු සාර්ථකව අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. සියලු විශ්වවිද්‍යාලවල තොරතුරු තාක්ෂණය සඳහා සිසුන්ගේ ප්‍රවීණතාව පරීක්ෂා කිරීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා සිසුන් විශ්වවිද්‍යාලවලට තෝරා ගැනීමේ සහ අනුයුක්ත කිරීමේ ක්‍රමය වැනි විසිඑක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මඟින් අරමුදල් සපයන වැඩසටහන්, සහ වෙනත් බොහෝ අභියෝගාත්මක ව්‍යාපෘති සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සහාය ලබා දෙන ලදී. පර්යේෂණ ව්‍යාපෘති සඳහා ජාතික පර්යේෂණ මණ්ඩලයේ (NRC) සහ ජාතික විද්‍යා පදනමෙහි (NSF) ප්‍රදාන කීපයක් ලබා ගැනීමට ද කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය සමත් විය.

පසුගිය වසර පහකට වඩා වැඩි කාලයක් පුරා ආයතනය විසින් මුහුණ පාන ලද උග්‍ර ඉඩකඩ පිළිබඳ ගැටලුව සමඟ දිගු කලක් පුරා කළ යුතුව තිබූ භෞතික සම්පත් සංවර්ධනය වසර තුළදී සිදු කරන ලදී. කෙසේ නමුත්, ඉදිරි පුළුල් කිරීම් සඳහා ඉඩ සැලසීමට තවත් යටිතල පසහුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කීපයක කටයුතු සම්පාදනය වෙමින් පවතී. රටෙහි වඩාත්ම සුදුසුකම් ලත් පරිගණන කාර්ය මණ්ඩලය රඳවා තබා ගන්නා අතර වසර තුළ දී තවත් කීපදෙනෙකු තම දර්ශන විශාරද උපාධිය සම්පූර්ණ කරමින් සිටී. ආයතනය සතුව දැනට දර්ශන විශාරද උපාධිධාරීන් 24ක් සිටින අතර එය අධ්‍යයන කාර්ය මණ්ඩල සංචිතය තවදුරටත් ශක්තිමත් කරමින් සිය මානව සම්පත් හිඟය සඳහා අර්ධ වශයෙන් පිළියමක් ලබා දෙයි.

දැනට ක්‍රියාත්මක උපාධි පාඨමාලා අන්තර්ජාතික ප්‍රමිතීන් හා පෙළ ගැස්වීමට විෂයමාලා සංවර්ධනය සම්පූර්ණ කිරීමත් සමඟ අපගේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය ද ඉහළ ඉංජිනේරු සහ වෛද්‍ය උපාධි මට්ටමට සමාන හෝ ඉහළ විය. වසර තුළදී ප්‍රථම සහ පශ්චාත් උපාධි සඳහා සිසුන් බඳවා ගැනීමේ මෙන්ම පර්යේෂණ ද ඇතුළත්ව ප්‍රථම සහ පශ්චාත් උපාධිධාරීන්ගේ නිමැවුමේ ද වැඩි වීමක් නිරීක්ෂණය කරන ලදී. මෙම වසරේදී ද අපගේ උපාධි පාඨමාලා සඳහා විදේශ ශිෂ්‍යයකු ආකර්ෂණය කර ගන්නා ලදී.

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සංක්ෂිප්ත සටහන**

| | | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| අධ්‍යාපනය ( ලියාපදිංචි වූ/ උපාධිය ලබා ගත් ) | | | | |
| අභ්‍යන්තර ප්‍රථම උපාධිධාරීන් | මුළු | 769 | 757 | 770 |
| | ඇතුළු වූ | 254 | 212 | 256 |
| | පිට වූ | 212 | 215 | 247 |
| විද්‍යා ප්‍රථම උපාධිධාරීන් | | 1275 | 1119 | 997 |
| බාහිර ඩිප්ලෝමා | මුළු | 4175 | 4535 | 4075 |
| | ඇතුළු වූ | 2034 | 2379 | 1890 |
| | පිට වූ | 611 | 515 | 334 |
| බාහිර උසස් ඩිප්ලෝමා | මුළු | 2391 | 2583 | 2509 |
| | ඇතුළු වූ | 714 | 721 | 690 |
| | පිට වූ | 305 | 339 | 226 |
| බාහිර උපාධි | මුළු | 1416 | 1537 | 1651 |
| | ඇතුළු වූ | 312 | 347 | 346 |
| | පිට වූ | 194 | 225 | 260 |
| පශ්චාත් උපාධි | මුළු | 303 | 370 | 452 |
| | ඇතුළු වූ | 143 | 209 | 186 |
| | පිට වූ | 122 | 107 | 121 |
| විස්තාරිත වැඩසටහන් | | 309 | 389 | 339 |
| **පර්යේෂණ** | | | | |
| පර්යේෂණ (දර්ශනපති/ දර්ශනශූරී) | මුළු | 39/07 | 41/09 | 42/09 |
| | ඇතුළු වූ | 09 | 07/06 | 08/01 |
| | පිට වූ | 6 | 3/1 | 3/1 |
| පර්යේෂණ ව්‍යාපෘති | මුළු | 05 | 10 | 11 |
| | නව | 1 | 6 | 3 |
| ප්‍රකාශන | | 70 | 67 | 71 |
| **උපදේශන ව්‍යාපෘති** | | | | |
| | දේශීය | 10 | 10 | 23 |
| | විදේශීය | - | - | 1 |
| සමාජ වගකීම් වැඩසටහන් | | 10 | 10 | 10 |

| | | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|
| පාලනය | | | | |
| ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය | සියලු | 36 | 40 | 38 |
| | මහාචාර්ය | 02 | 03 | 03 |
| | දර්ශන විශාරද | 20 | 20 | 23 |
| | පශ්චාත් උපාධි | 10 | 11 | 09 |
| ස්ථිර අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය | | 04 | 04 | 04 |
| තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය (උපදේශක සහ සහකාර කථිකාචාර්ය) | | 15 | 30 | 27 |
| ස්ථිර පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය | | 40 | 40 | 37 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය (අනියම් සහ පුහුණු වන්නන් ඇතුළත්ව) | | 49 | 42 | 42 |
| පර්යේෂණ/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය | | 11 | 27 | 24 |
| මූල්‍ය | | | | |
| | | 2013 | 2014 | 2015 |
| වාර්ෂික පුනරාවර්තන වියදම (ශ්‍රී.ල.රු මිලියන) | | 133 | 161 | 177 |
| භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) (ශ්‍රී.ල.රු මිලියන)- සත්‍ය, | | 90 | 94 | 122 |
| භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන) (ශ්‍රී.ල.රු මිලියන)—සත්‍ය | | 26 | 15 | 45 |
| උත්පාදිත ආදායම | | 242 | 247 | 211 |
| ප්‍රථම උපාධි සඳහා කො.වි.ප.අ. දායකත්වය (ශ්‍රී.ල.රු මිලියන) (උත්පාදිත %) | | 88 (37%) | 185 (75%) | 122 (58%) |
| කො.වි.ප.අ. අයවැය (ශ්‍රී.ල.රු මිලියන) | | 363 | 577 | 622 |
| පර්යේෂණ/ව්‍යාපෘති(ශ්‍රී.ල.රු මිලියන) | | 9.3 | 9.7 | 14 |
| සේවකයකු සඳහා පිරිවැය (ශ්‍රී.ල.රු '000) වසරකට | | 774 | 795 | 881 |
| ශිෂ්‍යයකු සඳහා පිරිවැය (ශ්‍රී.ල.රු '000) — භාණ්ඩාගාර පුනරාවර්තන | | 152 | 190 | 195 |
| යටිතල පහසුකම් | | | | |
| පුස්තකාල පොත් | | 8,303 | 8,678 | 8,783 |
| පරිගණක: කාර්ය මණ්ඩලය | | 1:1 | | |
| පරිගණක : ශිෂ්‍යයන් (සාමාන්‍ය සිසුන් )<br>(විශේෂ සිසුන්) | | 1:4<br>1:1 | | |
| ඉඩකඩ ප්‍රයෝජ්‍යකරණය (සේවකයා) (වර්ග මී.) | | 10.42 | 11.70 | 11.70 |
| ඉඩකඩ ප්‍රයෝජ්‍යකරණය (ශිෂ්‍යයා) (වර්ග මී.) | | 2.68 | 4.77 | 4.77 |

## කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC), කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක දෙපාර්තමේන්තුව (DCS) හා පරිගණක තාක්ෂණ ආයතනය (ICT) ඒකාබද්ධ කිරීමෙන් පරිගණක විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබා දීමේ, ප්‍රවර්ධනය කිරීමේ සහ සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා උසස් ඉගෙනුම් මධ්‍යස්ථානයක් වශයෙන් 1995 අංක 1 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මඟින් අවසන් වරට සංශෝධනය කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 24 (අ) 1 වගන්තිය යටතේ දෙන ලද නියෝගයක් මඟින් 2002 සැප්තැම්බර් 01 දින පිහිටුවන ලදී. පනතෙහි අර්ථය තුළ එය උසස් අධ්‍යාපන ආයතනයකි. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන (UCSC) ආඥා පනත 2002 නොවැම්බර් 15වන දින ගැසට් නිවේදනය කළ අතර ( ගැසට් පත්‍රිකා අංක 1262/32) ඩිජිටල් අධිකරණ වෛද්‍ය විද්‍යාව සඳහා මධ්‍යස්ථානයක් ඇතුළත් කිරීම සඳහා 2011 ජූලි මස 22දින (ගැසට් පත්‍රිකා අංක 1715/32) සංශෝධනය කරන ලදී.

**ඉතිහාසය පිළිබඳ කෙටි සටහනක්**

කොළඹ විශ්වවිද්‍යාලය තුළ පරිගණක අධ්‍යාපනය ආරම්භ වන්නේ වර්ෂ 1967 දී විද්‍යා පීඨයේ ගණිත අධ්‍යයනාංශයට සම්බන්ධ වෙනම ඒකකයක් ලෙස සංඛ්‍යාන විද්‍යා ඒකකය ඇරඹීමත් සමඟයි. පසුව මහාචාර්ය වී.කේ. සමරනායක මහතාගේ මූලික මඟ පෙන්වීම සමඟ මෙම ඒකකය සංඛ්‍යාන උපදේශන සහ දත්ත සැකසීමේ සේවා මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය විය. මෙය තවත් බොහෝ ඉදිරි සංවර්ධනයන් සඳහා මංපෙත් සැකසීය. 1985 වර්ෂයේ දී මෙම මධ්‍යස්ථානය සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (DSCS) බවට පත්විය. මෙම අධ්‍යයනාංශයේ ප්‍රධාන කර්තව්‍ය වූයේ සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව පිළිබඳ විශේෂ උපාධි වැඩසටහන් පැවැත්වීමයි. සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය එක් ශිෂ්‍ය කණ්ඩායමකින් 40 දෙනෙකු සඳහා පමණක් පරිගණක විද්‍යා විශේෂීකරණ වැඩසටහන පිරිනමන ලද අතර එය පරිගණක විද්‍යා ක්ෂේත්‍රයේ ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවීය.

1997 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා සිසුන් 50ක කණ්ඩායමක් පරිගණක විද්‍යාව හැදෑරීම සඳහා ඇතුළත් කර ගන්නා ලදී. කෙසේවුවද, මෙම කාලය වන විට පරිගණක විද්‍යා ක්ෂේත්‍රයේ ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශයේ පරිගණක විද්‍යා උප අංශය වෙනම අධ්‍යයනාංශයක් ලෙස ප්‍රසාරණය විය යුතු බව බොහෝ දෙනෙකු විසින් අවබෝධ කර ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2001වර්ෂයේ දී සඳහා සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, පරිගණක විද්‍යා අධ්‍යයනාංශය සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය නමින් අධ්‍යයනාංශ දෙකක් ලෙස වෙන් කරන ලදී.

පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, පීඨයක සීමාකාරී රාමුවක් තුළ ක්‍රියාත්මක වීමේ දී තම සීමාවන් හඳුනා ගත් අතර ඒ සමඟම අනාගත වර්ධන විභවයෙන් නිසි ඵල ලැබීම සඳහා සවිමත් කාර්මික සබඳතාවක් තිබීමේ වැදගත්කම ද අවබෝධ කර ගන්නා ලදී. කර්මාන්තය කෙරෙහි අවධානය යොමු කරන පරිගණක තාක්ෂණ ආයතනය (ICT) සහ න්‍යායික දැනුම කෙරෙහි හොඳින් දිශානත කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනාංශය අතර ක්‍රමෝපායික ඒකාබද්ධවීමක වැදගත්කම විශ්වවිද්‍යාලය විසින් අවබෝධ කර ගන්නා ලදී.

කර්මාන්තය සමඟ සවිමත් සම්බන්ධතාවක් ද ඒ සමඟම විදේශීය දායක නියෝජිතායතන සමඟ ඉහළ ආයතනික පැතිකඩක් ද පරිගණක තාක්ෂණ ආයතනය (ICT) සතුව තිබුණි. ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම්වල දී වැඩි ස්වාධිකාරයක් ද එම ආයතනය විසින් භුක්ති විඳින ලද අතර ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA), ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය ( SIDA) සහ වෙනත් දායක ආයතන කිහිපයකින් බොහෝ සම්පත් ප්‍රමාණයක් පහසුවෙන් ලබා ගැනීමට එමඟින් අවස්ථාව සැලසුණි.

මෙම ඒකාබද්ධ කිරීම 2002 වසරේ සැප්තැම්බර් 1වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය බිහි කරන ලද අතර ආයතනයේ අනුප්‍රාප්ත පරිශ්‍රමයන් රැසක දී සාර්ථකත්වය ළඟා කර ගැනීමට දූරදක්නා චින්තනය ලබා දුන් මහාචාර්ය වී.කේ. සමරනායක මහතා එහි ප්‍රාරම්භක අධ්‍යක්ෂවරයා විය. මේ සියලු දේ හරහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස සිය ආයතනය ස්ථානගත කර ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට හැකි වී ඇත.

විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පුළුල් කිරීමට ඇති සීමා හේතුවෙන් නැගෙනහිර සහ බටහිර ගොඩනැගිලි සංකීර්ණ විස්තීරණය කිරීමෙන් තවත් අමතර මහලක් සහ තලක්කටුවක් (roof top) පරිගණක අධ්‍යයනායතනය විසින් ඉදි කරන ලදී. භූමි ප්‍රමාණය සුළු වශයෙන් වැඩි කර ගැනීම සඳහා ගොඩනැගිල්ලට නැගෙනහිර සහ බටහිර කොටස් ද එක් කරන ලදී. මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය පරිපාලන සහ ආපනශාලා ගොඩනැගිල්ලේ මහල් දෙකක් ඉදි කර ඇති අතර ප්‍රථම උපාධිය සඳහා ඇතුළත් කර ගන්නා සිසුන් ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා ශ්‍රවණාගාරයක් සහ දේශන ශාලා ඉදි කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව

සිටියි. මෙම ප්‍රයත්නයන් මඟින් දිගු කලක් පුරා ව.මී 2කට අඩුව පැවති එක් ශිෂ්‍යයකුට අධ්‍යයන කටයුතු සඳහා වන ඉඩ ප්‍රමාණය ව.මී. 4.8 ක් ලෙස සැලකිය යුතු අන්දමකින් ඉහළ දැමීමට හැකි වී තිබේ.

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සංවිධානය**

මෙම වර්ෂයේදී ද අධ්‍යයනාංශ තුන සහ මධ්‍යස්ථාන හය තම වැඩසටහන් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ අධ්‍යයනාංශ**

ප්‍රථම උපාධි අධ්‍යයන පාඨමාලා සඳහා රජය විසින් ලබා දෙන අරමුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා සෘජුවම කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් ලබා ගනී. වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සිදු කරගෙන යාම සඳහා ලද අරමුදල් ප්‍රමාණවත් නොවූ බැවින් ප්‍රථම උපාධි අධ්‍යයන කාර්යයන් සඳහා උත්පාදිත ආදායමින් කොටසක් භාවිත කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සතුව අධ්‍යයනාංශ තුනක් පවතින අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය, ඔවුන්ගේ විශේෂීකරණය හා ඉගැන්වීමේ පළපුරුද්ද මත මෙම අධ්‍යයනාංශ වෙත අනුයුක්ත කර ඇත. කිසිදු අධ්‍යනාංශයක් තමාගේම පාඨමාලා පිරිනමන්නේ නොමැති බැවින්, අධ්‍යයනාංශ ප්‍රධානීන් තිදෙනා ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි සහ බාහිර සහ විස්තාරිත පාඨමාලා අධීක්ෂණය සඳහා අනුයුක්ත කර ඇත. අධ්‍යයනාංශ තුන වන්නේ,

1. පරිගණනය සහ බුද්ධිමය පද්ධති (CIS)
2. සන්නිවේදනය හා මාධ්‍ය තාක්ෂණ (CMT)
3. තොරතුරු පද්ධති ඉංජිනේරු (ISE)

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ මධ්‍යස්ථාන**

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය අද්විතීයක ක්‍රියාකාරකම් රැසක් ද සිදු කරයි. මෙම ක්‍රියාකාරකම් එකිනෙක වෙන් වූ මධ්‍යස්ථාන හයක් යටතේ සංවිධානය කර ඇත. මධ්‍යස්ථානයේ දෛනික ක්‍රියාකාරකම් කළමනාකරණය කරන සම්බන්ධීකාරකවරයෙකු සෑම මධ්‍යස්ථානයකම සිටී. මධ්‍යස්ථාන හය පහත පරිදි වේ.

1. ඩිජිටල් බහුමාධ්‍ය පිළිබඳ උසස් මධ්‍යස්ථානය ( ADMTC)
2. පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC)
3. බාහිර විභාග පිළිබඳ මධ්‍යස්ථානය (EDC)
4. විද්‍යුත් අධ්‍යාපනය(e-Learning) පිළිබඳ මධ්‍යස්ථානය (eLC)
5. වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය (PDC)
6. ඩිජිටල් අධිකරණ වෛද්‍ය මධ්‍යස්ථානය ( CDF)

**පාලනය**

පසුගිය වර්ෂය තුළ 2014- 2018 කාල පරිච්ඡේදය සඳහා වන සංයුක්ත සැලැස්ම පිළියෙල කරන ලදී. එහි අවධානය, අධ්‍යාපනය, පර්යේෂණ, උපදේශනය, සහ සමාජ වගකීම් යනාදී කළින් පැවැති මූලික ක්‍රියාකාරකම් ක්ෂේත්‍රවලින් ඉවතට යොමු වී කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ඉලක්ක සහ අරමුණු පදනම් කර ගත් ක්‍රමෝපායන් සඳහා හඳුනා ගත් වැඩසටහන් වෙත යොමු වන ලදී.

**කළමනාකරණය**

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කළමනාකරණය, අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්ගේ සහාය ඇතිව ආයතනයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. සියලු ව්‍යවස්ථාපිත සහ තේරීම් කමිටුවල සභාපතිත්වය අධ්‍යක්ෂ විසින් දරනු ලැබිය.

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ නිලධාරීන්**

**අධ්‍යක්ෂ** : මහාචාර්ය ජී.එන් වික්‍රමනායක ; **නියෝජ්‍ය අධ්‍යක්ෂ**: මහාචාර්ය කේ.පී. හේවාගමගේ

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ අධ්‍යයනාංශ ප්‍රධානීන්**
**CIS**: ආචාර්ය ඩී.ඒ.එස් අතුකෝරල; **CMT**:ජී.කේ.ඒ ඩයස් මයා (ඔක්තෝබර් දක්වා) සහ ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න ( නොවැම්බර් සිට) ; **ISE**:මහාචාර්ය කේ.පී. හේවාගමගේ

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්**
**ADMTC:** එස්.ටී නන්දසාර මයා; **CSC:** එල්.පී. ජයසිංහ මයා ; **EDC:** එල්.පී. ජයසිංහ මයා (සැප්තැම්බර් මස සිට); **eLC:** ආචාර්ය ඩී.ඩී. කරුණාරත්න; **PDC:** ආචාර්ය එස්.එම්.කේ.ඩී අරුණතිලක ; **CDF:** කේ.එස්.ගුණතිලක මයා

**අධිකාරීන්**

අධ්‍යයනායතනයේ අධිකාරීන් වනුයේ කළමනාකරණ මණ්ඩලය ;අධ්‍යයන පාලක මණ්ඩලය ;අධ්‍යයන මණ්ඩලය; අධ්‍යයනාංශ සහ මධ්‍යස්ථාන වේ.

**කළමනාකරණ මණ්ඩලය**
නව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය පත් කිරීමට සහ මණ්ඩලය සඳහා වි.ප්‍ර.කො. නාමිකයන් පත් කිරීමට සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් පෙර වර්ෂ හා සැසඳීමේ දී මෙම වර්ෂයේ රැස්වීම් වාර අඩු ප්‍රමාණයක් පවත්වා ඇත. වසර තුළ දී මාසික රැස්වීම් 11ක් සහ විශේෂ රැස්වීම් වාර 01ක් පවත්වා ඇත. කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

**අධ්‍යක්ෂ (සභාපති)** :මහාචාර්ය ජී.එන් වික්‍රමනායක ; **නියෝජ්‍ය අධ්‍යක්ෂ**: මහාචාර්ය කේ.පී. හේවාගමගේ; **නාමික, ලේකම් , උසස් අධ්‍යාපන අමාත්‍යාංශය:** පියදාස රණේපුර මයා (මාර්තු දක්වා) සහ එම් දේවසුරේන්ද්‍ර මයා (මැයි මස සිට);**නාමික, මුදල් අමාත්‍යාංශය:** ඩී.සී.ඒ ගුණවර්ධන මයා (ජනවාරි) සහ ඩී.එම්.ඒ හරස්ගම මිය (පෙබරවාරි මස සිට); **පීඨාධිපති, විද්‍යා පීඨය:** මහාචාර්ය කේ.ආර්.ආර් මහානාම; **අධ්‍යයනාංශ ප්‍රධානීන් CIS/ CMT/ ISE:** ආචාර්ය ඩී.ඒ.එස් අතුකෝරල, ජී.කේ.ඒ ඩයස් මයා (ඔක්තෝබර් දක්වා) ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න ( නොවැම්බර් සිට), ආචාර්ය කේ.පී. හේවාගමගේ; **පාලක සභා නාමිකයන්:** සී. මාලියද්ද (මාර්තු දක්වා), රංජිත් ජී.රුබසිංහ මයා (ජනවාරි) මහින්ද මදිහාවැව මයා (පෙබ-මාර්තු), කේ. කනගීශ්වරන් මයා (ජූනි-නොවැ), ආචාර්ය සංජීව විරවර්ණ (ජූනි සිට) , ජේ.එම්. ස්වාමිනාදන් මයා (දෙසැ.සිට); **සනාතන සභා නාමිකයන්**: මහාචාර්ය පී.එස්.එම්.ගුණරත්න ( ජන.-පෙබ.), මහාචාර්ය කේ.එච්. තෙන්නකෝන්( ජන.-පෙබ.), මහාචාර්ය සුමේධා ජයනෙත්ති ( මැයි සිට), සහ ආචාර්ය පවිත්‍රා කයිලාසපති (මැයි සිට); **වි.ප්‍ර.කො. නාමිකයන්:** සුජීව මුදලිගේ මයා ( ජන.), රුවන් කැරගල මයා ( ජූනි සිට) සහ දේශමාන්‍ය එම්.ඩී.ඩී.පීරිස් මයා ( ජන. හා ජූනි සිට);**තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ නියෝජිතයන්:** ඩී.බී.සපරමාදු මයා (ජන.), මනෝ සේකරම් මයා සහ රනිල් රාජපක්ෂ මයා(පෙබ. සිට); **අධ්‍යයන පාලක මණ්ඩලයේ නාමිකයන්:** ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න (ජන.-පෙබ.),ආචාර්ය ඩී.එන්. රණසිංහ (ජන.-පෙබ.), එස්.ටී නන්දසාර මයා (මාර්තු සිට), ආචාර්ය සී.අයි. කැප්පෙටියාගම (මාර්තු සිට) සහ ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා (මැයි සිට) ; **හිටපු අධ්‍යක්ෂ (ආරාධිත)**: අචාර්ය ඒ.ආර්. වීරසිංහ (ඔක්. දක්වා)

උප කමිටු දෙක, මූල්‍ය හා කළමනාකරණ කමිටුව, සහ විගණන කමිටුව කළමනාකරණ මණ්ඩලයට සහාය වන ලදී. සාමාජිකයන් පත් කිරීමට ප්‍රමාද වීමද මෙම උප කමිටු පැවැත්වීම කෙරෙහි බලපාන ලදී. කමිටු දෙකට වසර තුළදී අනුපිළිවෙලින් රැස්වීමට ලැබුනේ 03 වතාවක් සහ රුස්වීම් 03ක් පමණි. කමිටු දෙකෙහි සංයුතිය පහත දක්වා ඇත.

**මූල්‍ය හා කළමනාකරණ කමිටුව**

අධ්‍යක්ෂ (සභාපති) :මහාචාර්ය ජී.එන් වික්‍රමනායක ; නියෝජ්‍ය අධ්‍යක්ෂ: මහාචාර්ය කේ.පී. හේවාගමගේ; නාමික, ලේකම් , උසස් අධ්‍යාපන අමාත්‍යාංශය: පියදාස රණේපුර මයා (මාර්තු දක්වා); පීඨාධිපති, විද්‍යා පීඨය: මහාචාර්ය කේ.ආර්.ආර් මහානාම; සුජීව මුදලිගේ මයා ( ජන.දක්වා), දේශමාන්‍ය එම්.ඩී.ඩී.පීරිස් මයා ( ජන. හා ජූනි සිට), ආචාර්ය පවිත්‍රා කයිලාසපති (මැයි සිට), මනෝ සේකරම් මයා.

**විගණන කමිටුව**

සභාපති : ඩී.එම්.ඒ හරස්ගම මිය (පෙබරවාරි මස සිට);මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක ( අධ්‍යක්ෂ-නිරීක්ෂක) ; නියෝජ්‍ය අධ්‍යක්ෂ: මහාචාර්ය කේ.පී. හේවාගමගේ; නාමික, ලේකම් , උසස් අධ්‍යාපන අමාත්‍යාංශය: පියදාස රණේපුර මයා (මාර්තු දක්වා) සහ එම් දේවසුරේන්ද්‍ර මයා (මැයි මස සිට); රුවන් කැරගල මයා ( ජූනි සිට), විගණකාධිපති නියෝජිතයන්:ආර්.පී.එස්. පද්මිණි

මිය (ඔක්. දක්වා) ආර්.එම්.පී.ඒ. ජනක මයා ( නොවැ. සිට);අභ්‍යන්තර විගණක /වි.ප්‍ර.කො:ජනක බෝගමුව මයා, අභ්‍යන්තර විගණක ( කො.වි.වි): කේ.ඊ.ඩබ්. ජයසිරි මයා, නියෝජිත / E&Y විගණකයෝ: පී.ඩී.ඒ වීරසූරිය මිය

අධ්‍යයන පාලක මණ්ඩලය

වසර තුළදී අධ්‍යයන කමිටු රැස්වීම් වාර 13ක් පවත්වා ඇත. අධ්‍යයන පාලක මණ්ඩලයේ සංයුතිය පහත පරිදි වේ.

අධ්‍යක්ෂ; නියෝජ්‍ය අධ්‍යක්ෂ; අධ්‍යයනාංශ ප්‍රධානීන් ( CIS/CMT/ISE); මධ්‍යස්ථාන සම්බන්ධිකාරකවරුන් (ADMTC/CSC/EDC/eLC/PDC); **නාමික ( විද්‍යා පීඨය):** මහාචාර්ය ආර්.ඩී. විජේසේකර; තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ නියෝජිතයන්: නොමැත ;ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් ( කො.වි.ප.ආ) ; **ඉගැන්වීම් කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක්:** එම්.පී.එම්.කේ. සිල්වා මහතා; ආචාර්ය ටී.ඒ වීරසිංහ ( ජූලි සිට); ආචාර්ය එච්.ඊ.බී.එච්.බී. ඒකනායක ( අප්‍රියෙල් සිට); එම්. ප්‍රේමචන්ද්‍ර මිය (සැප්. දක්වා) ; **අධ්‍යයන මණ්ඩලය ( අභ්‍යන්තර ප්‍රථම උපාධි):** එම්.අයි.ඊ වික්‍රමසිංහ මහතා ( නොවැ.සිට)

අධ්‍යයන මණ්ඩලය

අභ්‍යන්තර ප්‍රථම උපාධි (IUD) , පර්යේෂණ සහ උසස් උපාධි (RHD) , සහ බාහිර සහ විස්තාරිත වැඩසටහන් (EEP) නමින් අධ්‍යයන මණ්ඩල තුනක් ඇත. එම මණ්ඩල අභ්‍යන්තර ප්‍රථම උපාධි, පර්යේෂණ සහ උසස් උපාධි සහ බාහිර සහ විස්තාරිත වැඩසටහන් සම්බන්ධව කටයුතු කරයි. මෙම මණ්ඩල තුන වසර තුළ දී අනුපිළිවෙලින් රැස්වීම් 11,12, සහ 12ක් වසර තුළ දි පවත්වා ඇත.

## අධ්‍යාපනය

### වැඩසටහන් සහ ශිෂ්‍යයන්

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය පුළුල් විවිධත්වයකින් යුත් වැඩසටහන් විවිධ මට්ටම්වල දී පිරිනමනු ලබයි. වගුව 1 ආයතනය මඟින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා ( වැඩසටහන්) සමඟ සම්බන්ධිත ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු දක්වයි.

වගුව 1: පිරිනමනු ලබන පාඨමාලා වර්ග

| පාඨමාලාව | මුළු සිසුන් සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| ප්‍රථම සහ පශ්චාත් උපාධි වැඩසටහන් | 1,222 | 64 | 60 |
| පර්යේෂණ සහ අනෙකුත් ව්‍යාපෘති | 45 | 35 | 25 |
| විස්තාරිත පාඨමාලා | 339 | 1 | 36 |
| බාහිර උපාධි | 8,235 | 48 | 39 |
| මාර්ගගත | 10,995 | 4 | 9 |
| වෙනත් - විද්‍යා පීඨය | 997 | 15 | 2 |

### ප්‍රථම උපාධි අධ්‍යාපනය

ප්‍රථම උපාධි සිසුන් සඳහා පරිගණනය පළමුව හඳුන්වා දෙන ලද්දේ විද්‍යා පීඨයේ කොටසක් ලෙස 1967 තරම් ඈත කාලයක දීය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මෙම අවස්ථාව විද්‍යා පීඨ සිසුන් 997ක් සඳහා නොකඩවා පිරිනමනු ලබයි. පරිගණනය උපාධියක් වශයෙන් ආරම්භ කරන ලද්දේ 1990 දීය. එක්ව ගත්කල ප්‍රථම උපාධි සිසුන් 1,767ක් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය තුළ පුහුණුව ලබයි. පරිගණක අධ්‍යයනායතනය දැනට සිසුන් 468ක් සඳහා පරිගණක විද්‍යා උපාධිය ද (CS), සිසුන් 21ක් සඳහා මෘදුකාංග ඉංජිනේරු විද්‍යා උපාධිය ද, සිසුන් 281 ක් සඳහා තොරතුරු පද්ධති උපාධිය ද ( IS/ICT) පිරිනමනු ලබයි.

#### අභ්‍යන්තර උපාධි

උපාධි පාඨමාලාවන්හි යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර එය අධ්‍යයන වර්ෂ 2012/2013 සිට ක්‍රියාත්මක කරන ලදී.

පහත උපාධි පිරිනැමීම සඳහා පරිගණක විද්‍යා උපාධිය ප්‍රතිව්‍යුහගත කරන ලදී. තොරතුරු තාක්ෂණ, තොරතුරු පද්ධති, සහ පරිගණක විද්‍යා වෘත්තිකයන්ට ලොව පුරා ඇති ඉහළ ඉල්ලුම සපුරාලීමට අමතරව අපේක්ෂිත උපාධිධාරී ගුණාංග ළඟා කර ගැනිම සඳහාත් IEEE/ACM විෂයමාලා නිර්දේශ සමඟ අනුකූල වීම සඳහාත් යෝජිත විෂයමාලාව සැලසුම් කර ඇත.

i. වසර තුනක පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ( BSc in CS)
ii. වසර හතරක පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (B.Sc Hons. in CS)
iii. වසර හතරක මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිලිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (BSc Hons in SE)

ව්‍යාපාරික අවශ්‍යතා සහ තාක්ෂණික විසඳුම් අතර හිදැස පිරවීම සඳහා නව වර්ගයක තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බිහි කිරීමට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධි වැඩසටහන ( BCIT) තොරතුරු පද්ධති උපාධිය ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලදී. මේ වන විට පැරණි තොරතුරු හා සන්නිවේදන උපාධි වැඩසටහන හදාරනුයේ සිව් වන වසර සිසුන් පමණි. තොරතුරු පද්ධති උපාධිය මෙම නව වර්ගයේ තොරතුරු සහ සන්නිවේදන වෘත්තිකයන් බිහි කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහනේ විෂයමාලාව, සන්නිවේදනය, කණ්ඩායම් වැඩ වැනි මෘදු කුසලතාවල වැදගත්කම ද අවධාරණය කරයි.

මෙම වැඩසටහන යටතේ පිරිනමනු ලබන උපාධි පහත පරිදි වේ.

i. වසර තුනක තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය ( BSc in IS)
ii. වසර හතරක තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ( BSc Hons in IS)

පැවති වසර 3න් පිටවීම සහ 3+1 ( වසර 4) වෙනුවට 2+1 (වසර 3) සහ 2+2 (වසර 4) උපාධි පාඨමාලා නැවත සැලසුම් කරන ලදී. නව පරිගණක විද්‍යා විෂය ධාරාවේ වැඩසටහන දැනට පවතින වසර 3ක සහ 4ක පරිගණක විද්‍යා වැඩසටහනට අමතරව විද්‍යාව වසර 4ක මෘදුකාංග ඉංජිනේරු විද්‍යා විෂය ධාරාවකින් ද සමන්විත වේ. පළමු වසර දෙකෙහි ශිෂ්‍යයන් නව විෂයමාලාව හදාරන අතරතුර තෙවන වසර ආරම්භයත් සමඟ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව සහ පරිගණක විද්‍යාව සඳහා පළමු සිසුන් කණ්ඩායම තෝරා ගන්නා ලදී. කෙසේ නමුත්, සිව්වන වසර සිසුන් පෙර පැවති උපාධි පාඨමාලා නොවෙනස්ව හදාරන ලදී. පරිගණක විද්‍යා උපාධිය සඳහා උසස් පෙළ භෞතික විද්‍යා විෂය ධාරාවේ සිසුන් තෝරා ගනු ලබන අතර තොරතුරු පද්ධති උපාධිය සියලු විෂය ධාරා සඳහා විවෘතය.

සංශෝධිත විෂයමාලාව සන්නිවේදනය, කණ්ඩායම් වැඩ වැනි මෘදු කුසලතාවල වැදගත්කම ද අවධාරණය කර ඇත. ඕනෑම උ/පෙළ විෂය ක්ෂේත්‍රයක් සඳහා විවෘත තොරතුරු පද්ධති වැඩසටහන සුදුසුකම් ලත් සිසුන් තෝරා ගැනීම සඳහා යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වන ලදී. ඊළඟ සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළ යෝග්‍යතා පරීක්ෂණය ජූලි මස 14වන දින පවත්වන ලද අතර සිසුන් 1789දෙනෙක් මෙම පරීක්ෂණය සඳහා පෙනී සිට 502ක් සුදුසුකම් ලබන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2014/2015 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි ප්‍රථම උපාධි පාඨමාලා සඳහා නව ඇතුළත්වීමේ පොතක් පළ කර ඇත. පෙර වර්ෂයේ ඇතුළත් කර ගත් 275 ක් වූ ඉහළ සිසුන් සංඛ්‍යාව නොවෙනස්ව පවත්වා ගෙන ගොස් ඇත. ( පරිගණක විද්‍යාව 175, තොරතුරු පද්ධති 100)

**ලියාපදිංචිය**

2014/2014 සිසුන් ඇතුළත් කර ගැනීම යටතේ පරිගණක විද්‍යා උපාධිය හැදෑරීම සඳහා සිසුන් 163දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් ද තොරතුරු පද්ධති උපාධිය හැදෑරීම සඳහා සිසුන් 93ක් ද කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට ඇතුළත් කර ගන්නා ලදී. 2015 වර්ෂයේ දී ආයතනය තුල ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 757 ක් ලෙස පැවතුණි. මෙම සංඛ්‍යාවේ බණ්ඩනය වගුව 2 මගින් දක්වා ඇත. බොහෝ සිසුන් තෙවන වසර කාර්මික පුහුණුව සම්පූර්ණ කිරීමටත් පෙර පිළිගත් ආයතන මඟින් වාසිදායක ගිවිසුම් මත ඔවුන් සේවයට බඳවා ගන්නා බව නිරීක්ෂණය විය. සිව්වන වසර සඳහා සිසුන් තෝරා ගැනීම පෙබරවාරි 20වන දින සිදු කරන ලද අතර අධ්‍යයන වර්ෂය පෙබරවාරි 23වන දින ආරම්භ කරන ලදී. නව සිසුන් සඳහා හඳුන්වාදීමේ වැඩසටහන පෙබරවාරි 6 පැවැත්විණි.

**බාහිර කාර්ය මණ්ඩලය**

සියලුම අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සහභාගී විය. බාහිර සහයෝගය අවශ්‍ය වන බොහෝ පාඨමාලා තොරතුරු තාක්ෂණ උපාධි වැඩසටහන තුළ අන්තර්ගතය. තොරතුරු සන්නිවේදන තාක්ෂණ / තොරතුරු පද්ධති උපාධි පාඨමාලා 09 ක් සහ එක් පරිගණක විද්‍යා පාඨමාලාවක් පැවැත්වීම සඳහා පුද්ගලයින් 11දෙනෙකුට බාහිර කථිකාචාර්යවරුන් ලෙස ආරාධනා කරන ලදී.

වගුව 2 : අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන්

| පාඨමාලාව | 2014 බඳවා ගැනීම | පළමු වසර සිසුන් | 2වන වසර සිසුන් | 3වන වසර සිසුන් | 4වන වසර සිසුන් | මුළු එකතුව | උපාධි ලබා ගත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යා උපාධිය | - | - | - | 154 | - | 154 | 103 |
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 175 | 143 | 149 | - | 40 | 332 | 39 |
| තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 100 | 69 | 101 | - | - | 170 | - |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | - | - | - | - | 23 | 23 | 20 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධිය | - | - | - | 78 | - | 78 | 53 |
| **කො.වි.ප.අධ්‍යනායතනයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්** | **275** | **212** | **250** | **232** | **63** | **757** | **215** |
| විද්‍යාපීඨයේ විද්‍යාවේදී | - | 553 | 363 | 45 | 36 | 997 | - |
| **අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයන්** | **275** | **765** | **613** | **277** | **99** | **1754** | **215** |

සියලු පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලදී.

**කාර්මික පුහුණුව සඳහා සිසුන් අනුයුක්ත කිරීම**

වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC) තොරතුරු තාක්ෂණ කර්මාන්තය සමඟ සමීප සබඳතා පවත්වා ගන්නා ලද අතර කර්මාන්ත හවුල්කාරත්වයෙන් අධ්‍යයන වැඩසටහන් ඉහළ නංවා එයින් ප්‍රථම උපාධිධාරීන්ගේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා කටයුතු කරන ලදී. 2014 වර්ෂයේ දී වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය ප්‍රථම උපාධි අපේක්ෂකයන් 230දෙනෙකු ඔවුන්ගේ මාස 6ක පුහුණුව සඳහා පරිගණක අධ්‍යයනායතන ව්‍යාපෘති 08කද ඇතුළත්ව ආයතන 73කට අනුයුක්ත කරන ලදී. වසරේ පසු භාගයේ දී සිසුන් 247දෙනෙකුගෙන් යුතු ඊළඟ කණ්ඩායම කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ව්‍යාපෘති 13කද ඇතුළත්ව ආයතන 81ක ස්ථානගත කරන ලදී. මෙම සිසුන් 2016 ජනවාරි මාසයේ දී තම පුහුණුව නිම කිරීමට අපේක්ෂිතය. වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය විසින් උපාධි ලබා ගැනීමෙන් අනතුරුව වෘත්තිකයන් වශයෙන් තමාට සිදු කිරීමට ඇති කාර්ය භාරය පිළිබඳ උපාධි අපේක්ෂකයන් දැනුවත් කිරීම සඳහා ස්වේච්ඡාවෙන් ලබා දෙන ආරාධිත දේශන මාලාව සඳහා සහභාගී වීම සඳහා සමාගම් සංවිධානය කරවන ලදී. කාර්මික පුහුණුවට හැරුණු කොට උපාධි ලබා පිටවන සිසුන්ට රැකියා අවස්ථා සැපයීමට අමතරව සම්මුඛ පරීක්ෂණ, වෘත්තිය කුසලතා සංවර්ධනය වැනි දේ වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලදී.

**නේවාසිකාගාර**

කොළඹ විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ප්‍රතිපත්තිය හා අනුගාමී වෙමින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය වසර තුළදී, නේවාසිකාගාර වඩාත් අවශ්‍ය වන පළමු වසර මෙන්ම 3වන සහ 4වන වසරවල ප්‍රථම උපාධි සිසුන් සඳහා නේවාසික පහසුකම් සපයන ලදී. එම කාර්යය වෙනුවෙන් පහත නේවාසිකාගාර කුළියට හෝ බද්දට ලබා ගන්නා ලදී. බත්තරමුල්ල ශිෂ්‍ය නේවාසිකාරාගර ශිෂ්‍යයන් 27 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් සපයන ලද අතර ( පළමු වසර 10, තෙවන වසර 17; ශාලාධිපති -ආචාර්ය කේ.එල් ජයරත්න; උප ශාලාධිපති - එම්.අයි.ඊ. වික්‍රමසිංහ මහතා) කොහුවල පිහිටි සිසුවියන් සඳහා වූ නේවාසිකාතගාරයේ ශිෂ්‍යාවන් 33දෙනෙකු සඳහා නේවාසික පහසුකම් සපයන ලදී ( පළමු වසර -18, තෙවන වසර 13, සිව්වන වසර -02; උප ශාලාධිපතිනිය - ජේ.එච්.කේ. තියුමිණි මිය).

**ආපනශාලාව**

විශ්වවිද්‍යාල භූමියේ ආපනශාලා ගණනාවක් ක්‍රියාත්මක වුවද සමාලෝචිත වර්ෂය තුළ දී කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විශේෂයෙන් තම සිසුන් සඳහා වෙනම ශිෂ්‍ය ආපනශාලාවක් පවත්වාගෙන යන ලදී. පසුගිය වර්ෂයේ දී ආරම්භ කරන ලද නව ආපන ශාලාව ඉදි කිරීම වසර තුළ දී සම්පූර්ණ කරන ලදී. නව ආපන ශාලාව තුළ සිසුන් 120ක් සඳහා ඉඩ පහසුකම් ඇති අතර අහාර පිළිගැන්වීමට,රූපවාහිනී නැරඹීමට සහ අන්තර්ජාල ප්‍රවේශයට පහසුකම් සළසා ඇත. නව ආපනශාලාව පවත්වා ගෙන යාම පළමුව පරිපාලන මධ්‍යස්ථානයේ ( College House) ආපනශාලාව පවත්වාගෙන යන පුද්ගලයන්ට පැවරුවද පොරොන්දු වූ සේවාව ලබා දීමට ඔවුන් අපොහොසත් වූ බැවින් කලා පීඨයේ ආපනශාලාව පවත්වාගෙන යන පුද්ගලයන්ට එය

භාර දෙන ලදි. විශේෂයෙන්ම ආයතනයට වෙන් කරන ලද ප්‍රමාණවත් නොවන අරමුදල් හේතුවෙන් ආපනශාලා ගෘහභාණ්ඩ සැදීමේ ප්‍රමාදයක් ඇතිවිය.

උපදේශනය

ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක මිය, ආචාර්ය ඒ.ආර් වීරසිංහ ( ඔක්තෝබර් 31 දක්වා) ආචාර්ය ටී.ඒ.වීරසිංහ මිය, ආචාර්ය ටී.එම්.එච්.ඒ යූසෆ් ( ඔක්තෝබර් දක්වා) එච්.ඊ.එම්.එච්.බී. ඒකනායක මයා ( නොවැම්බර් සිට), ජී.පී.සෙනවිරත්න මයා ( නොවැම්බර් සිට), අචාර්ය ටී ශ්‍රීධරන් ( නොවැම්බර් සිට) යන ශිෂ්‍ය උපදේශකයන් සිව් දෙනෙකුගේ ( අනතුරුව පහ දක්වා වැඩි කරන ලදී) සියලු සිසුන් සඳහා ලබා දෙන ලදී. තවද උපදේශනය අවශ්‍ය සිසුන් සඳහා වෘත්තිමය උපදේශකයකුගේ සේවය සතියකට පැය තුනක කාලයකට ලබා ගන්නා ලදී. සාමාන්‍යයෙන් සිසුන් 5ක් පමණ උපදේශන ලබා ගැනීම සඳහා පැමිණෙන අතර විභාග පැවැත්වෙන කාලය වැනි ඇතැම් නිශ්චිත කාලයන්හිදී තවත් 10-15ක් පමණ වූ සිසුන් ප්‍රමාණයක් උපදේශනය ලබා ගනියි.

ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා මූල්‍ය අනුග්‍රහය

මහපොළ ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, කර්මාන්ත ශිෂ්‍යත්ව, සහ පෞද්ගලික ශිෂ්‍යත්ව යනාදි ලෙස ශිෂ්‍යයන් සඳහා මූල්‍ය අනුග්‍රහය සපයන ලදී.

මහපොළ ශිෂ්‍යත්ව

වෙළඳ සහ පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයේ මහපොළ භාරකාර අරමුදල මඟින් අනුග්‍රාහකත්වය සපයන මහපොළ ශිෂ්‍යත්ව සිසුන් 308දෙනෙකු සඳහා පිරිනමන ලදී. කුලසතා සහ සාමාන්‍ය ශිෂ්‍යත්වයක වටිනාකම අනුපිළිවෙලින් රු. 2,550/- සහ රු.2,600ක් විය. මැයි මාසයේ දී මෙම මුදල රු. 5,000/-ක් හා 5,050/-ක් ලෙස ඉහළ නංවන ලදී.

ශිෂ්‍යාධාර

ශිෂ්‍යාධාර සඳහා සිසුන් තෝරා ගැනීම සම්බන්ධයෙන් වන වි.ප්‍ර.කො චක්‍රලේඛ අනුව ශිෂ්‍යාධාර පිරිනමන ලදී. සිසුන් 145දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර පිරිනමන ලදී. 2015 වර්ෂය සඳහා ශිෂ්‍යාධාරලාභීන්ගේ අනු බණ්ඩනය පහත වගුවෙහි දක්වා ඇත. පූර්ණ ශිෂ්‍යාධාරයක සහ අර්ධ ශිෂ්‍යත්වයක වටිනාකම අනුපිළිවෙලින් රු. 2,000/- සහ 1,900/- ක් විය. මැයි මාසයේ දී මෙම අගය රු. 2,400/- සහ 2,500/- දක්වා ද ඔක්තෝබර් මාසයේ සිට එය නැවතත් රු. 3,900/- සහ 4,000/- දක්වා ද ඉහළ නංවන ලදී.

නේවාසිකාගාර පහසුකම්

තෙවන වසර සිසුන් වසරින් අඩක් කර්මාන්ත පුහුණුව සඳහා අනුයුක්තව සිටින බැවින් නේවාසිකාගාර පහසුකම් සාමාන්‍යයෙන් සපයනු ලබන්නේ පළමු වසර සිසුන්ට පමණි. එහි පුරප්පාඩු පැවති බැවින් තෙවන වසර සිසුන් සඳහා ද එය විවෘත විය.

මහපොළ, ශිෂ්‍යාධාර සහ නේවාසිකාර සපයනු ලැබූ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුවෙන් ලබා දී ඇත.

| ඇතුළත් වූ අධ්‍යයන වර්ෂය | ඉගෙනුම ලබන වසර | මහපොළලාභීන් (CS සහ IS / ICT) | ශිෂ්‍යාධාරලාභීන් (CS සහ IS / ICT) | නේවාසිකාගාර පහසුකම් ( පිරිමි සහ ගැහැණු) |
|---|---|---|---|---|
| 2013/14 | පළමු වසර | 90 (63+27) (35%) | 87 (55+32) (34%) | 28 (10+18) (11%) |
| 2012/13 | දෙවන වසර | 80 (69+11) (39%) | 14 ( 9+5) (7%) | - |
| 2011/12 | තෙවන වසර | 116 (70+46) (47%) | 40 ( 15+25) (16%) | 30 (17+13) (12%) |
| 2010/11 | සිව්වන වසර | 22 (16+6) (37%) | 4 (2+2) (7%) | 02 (0+2) (03%) |

කර්මාන්ත ශිෂ්‍යත්ව

ශිෂ්‍ය ශුභසාධක සහ ආපදා අරමුදල - 16 (මාසිකව රු. 2,500/- බැගින් මාස 10 ක් සඳහා); IFS R&D (IFS) -08 (මාසිකව රු. 2,500/- බැගින් මාස 12 ක් සඳහා); සහ MIND -2 ( මාසිකව රු. 2,000/- බැගින් මාස 12) ලෙස එක් අභ්‍යන්තර අරමුදල් ප්‍රභවයක් සහ බාහිර සංවිධාන දෙකක් අවශ්‍යතා සහිත සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අනුග්‍රහය දක්වන ලදී.

"Shorea Robusta" ශිෂ්‍යත්ව

පෙර පැවති පරිගණක විද්‍යා විශේෂ උපාධි වැඩසටහනේ ආදි විද්‍යාර්ථීන් විසින් 2007 වර්ෂයේ දී හඳුන්වා "Shorea Robusta" ශිෂ්‍යත්වය සිව්වන වසර ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා හඳුන්වා දෙනු ලැබීය. 2015 වර්ෂයේදී මෙම යෝජනා ක්‍රමය හරහා

ශිෂ්‍යත්ව 2ක් ප්‍රදානය කරන ලද අතර ශිෂ්‍යත්වයක වටිනාකම එක් මාසික වාරිකයක් රු.2,500/- ක් වූ අධ්‍යයන වර්ෂයක් සඳහා වාරික 10කි. තෝරා ගැනීම ශිෂ්‍යයන්ගේ කාර්යසාධනය සහ මූල්‍යමය අවශ්‍යතා මත පදනම් විය.

**කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ශිෂ්‍ය සංගමය**

2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන අඥාපනතේ උප වගන්ති 25 සහ 26 අනුව 2014/15 වර්ෂය සඳහා ශිෂ්‍ය සංගම් ඡන්දය පැවැති අතර නිලධාරී මණ්ඩලය නිතරඟයෙන් තෝරා පත් කර ගන්නා ලදී. **සභාපති:** එස්.එල්.ආර් ද සිල්වා; **උප සභාපති:** ඩබ්.ඒ.ආර්.ආර්. සෝමවීර; **ලේකම්:** ඩී.ටී.ඒ.එච්.එන්. දිසානායක; **කණිෂ්ඨ භාණ්ඩාගාරික:** ඩබ්.පී.එම්. ප්‍රියන්ජ, **කතෘ:** ආර්.සී.බී රාජපක්ෂ; **කමිටු සාමාජිකයන්:** එස්.එස්.බී විජේරත්න, එස්.ඩී.එල්.එච්. සඳනායක, එස්. ආභිලේන්ද්‍රන්, ඒ.ඒ.එෆ්.එම් ෆස්ලි; **ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික:** එම්.පී.එන්.ඒ.එස් ප්‍රනාන්දු.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම්**

ශිෂ්‍ය සංගමය හරහා සිදු කරන ලද ශිෂ්‍ය ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් සංස්කෘතික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා විය. අප්‍රියෙල් මස සිසුන් විසින් ක්‍රීඩා දිනයක් සහ අවුරුදු උත්සවයක්; මැයි 03 වෙසක් පහන් කූඩු; මැයි 05 දන්සලක්; මැයි 8 පැදුර; පොසොන් ගී ජූනි 03; මහාචාර්ය සමරනායක මහතා වෙනුවෙන් බණක් ජූනි 05 දින; විසිර යාම සැප්තැම්බර් 19; නවකයන්ගේ ක්‍රිකට් තරඟාවලිය සහ නවකයන් පිළි ගැනීම සැප්තැම්බර් 26; ලේ දන්දීමේ කඳවුර ඔක්තෝබර් 01; පිළිකා රොහල සඳහා පරිත්‍යාග; පිරිත් සජ්ඣායනාව මාර්තු 20 සහ නොවැම්බර් 04; "වනි විලා" ඔක්තෝබර් 22 සහ නත්තල් ගස සහ බැති ගී දෙසැම්බර් 30 පවත්වන ලද අතර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ශිෂ්‍යයන් විසින් අ.පො.ස (සා.පෙ) සහ (උ.පෙළ) සිසුන්ට සහාය වීම සඳහා පාසල් සහ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ දී වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. අධ්‍යක්ෂතුමා ද ඇතුළත්ව කාර්ය මණ්ඩල සමාජිකයන් පිරිසකගේ සහභාගීත්වයෙන් මාතර දී වැඩමුළුවක් පවත්වන ලදී.

**ශිෂ්‍යයන් ලද ජයග්‍රහණ**

ශිෂ්‍යයන් විසින් "**National Best Quality ICT Awards (NBQSA)** තෘතික (තාක්ෂණය) සඳහා වූ NBQSA ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදී: ඩබ්ලි.කේ.ඒ.එස් විජේසිංහ අක්ෂි රෝග විශේෂඥයන් සඳහා දියවැඩියාව නිසා ඇසේ රෙටිනාවේ හට ගන්නා රෝගී තත්තවයක් සඳහා ස්වයංජනිතව පිරික්සනයක් " Autogenous Diabetic Retinopathy Censor for Ophthalmologists –" AKSHI" වෙනුවෙන් තෘතික (තාක්ෂණය) සඳහා වූ NBQSA ලෝකඩ පදක්කම ද " වී වගාවේ දී නයිට්‍රජන් පොහොර ඵලදායි ලෙස භාවිත කිරීම - Effective Utilization of Nitrogen Fertilizer in Paddy Cultivation" වෙනුවෙන් තෘතික (ව්‍යාපාරික) පදක්කමද දිනා ගන්නා ලදී. ඩබ්ලි.කේ.ඒ.එස් විජේසිංහ ගේ " Autogenous Diabetic Retinopathy Censor for Ophthalmologists –" AKSHI" ආසියානු පැසිපික් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේ දී කුසලතා සම්මනායක් දිනා ගැනීමට ද සමත් විය.

"**Imagine Cup**" යනු විශ්වවිද්‍යාල සිසුන් අතර විවිධ කාණ්ඩ යටතේ පවත්වනු ලබන වාර්ෂික තරඟයකි. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සිසුන් ක්‍රීඩා කාණ්ඩය යටතේ තෙවැනි ස්ථානය ලබා ගන්නා ලදී: " the OOPS Creators" "IEEE Extreme 9.0" ගෝලීය වැඩසටහන්කරණ තරඟාවලිය ආයතනයෙන් සිසුන් 200 කට වැඩි පිරිසකගේ (කණ්ඩායම් 81) ක සහභාගීත්වයෙන් ඔක්තෝබර් 24දින පැය 24ක කාලයක් පුරා පැවැත්විණි. Extreme තරඟාවලි ඉතිහාසය පුරා ලබා ගත හැකි වූ හොඳම ලකුණු වාර්තා කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ඉහළම කණ්ඩායම් සමත් වුහ. අපගේ ඉහළම කණ්ඩායම " Hal9000" ශ්‍රී ලංකාවේ හයවන ස්ථානයට ද ලොව 145වන ස්ථානයට ද පත්විය. ලොව පළමු 200 තුළට කණ්ඩායම් තුනක් පත් කිරීමට අපට හැකි විය.

සිසුන් විසින් "Reid Cyber Wars" පරිගණක ක්‍රීඩා තරඟාවලිය ජූනි මස 17 දින පවත්වන ලදී. සැප්. 5 සහ 6 දින පැය 24 "hackathon" තරඟයක් සිසුන් විසින් සංවිධානය කරන ලදී.

**ක්‍රීඩා**

පහත සඳහන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සිසුන් කොළඹ විශ්වවිද්‍යාලයේ අදාළ ක්‍රීඩාවන්හි උප නායක තනතුරට පත් කරන ලදී: කැරම් ( කාන්තා) -ටී.ඒ.කේ. ලොවනා සහ ටයිකොන්ඩෝ (පිරිමි) -ඩබ්.ඒ.එම්.එස්. වීරසූරිය

පහත නම් සඳහන් සිසුන් 2015 වර්ෂයේදී සඳහන් කරන ඇති කුසලාන දිනා ගන්නා ලදී: පී.එච්.සී කරුණාරත්න- අන්තර් විශ්වවිද්‍යාලයීය ජවන සහ පිටිය කුසලතා සම්මානය සහ එස්.එස්. විතානගේ - අන්තර් විශ්වවිද්‍යාලයීය පිහිනුම් තරඟාවලියේ හොඳම කාර්යසාධනය වෙනුවෙන් මහාචාර්ය තිලක් හෙට්ටිආරච්චි අභියෝගතා කුසලානය.

2015 වර්ෂයේ දී පහත නම් සඳහන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සිසුන් 32 විශ්වවිද්‍යාලයීය වර්ණ දිනා ගන්නා ලදී. *මගින් නැවත දිනා ගත් සිසුන් දක්වා ඇත.

**බැඩ්මින්ටන්: (පි)**- පී.එම්. රණතුංග; **(කා)** *ටී.එස්. දහනායක. **කැරම්: ( පි)** බී.බී.පී. ප්‍රසංග, පී.වයි. ගුණරත්න; **(කා)**- ඩබ්.ඩී.එම්. වීරකෝන්, *එම්.පී.බී.එස් විජේරත්න, *ටී.ඒ.කේ.ලෝචනා. **චෙස්: (පි)** -*එම්.ඩී.වයි.පෙරේරා. **එල්ලේ: (පි)**- යූ.එස්.ඒ. විජේසේකර, * ජී.ඒ. මධුශංක; **(කා)** කේ.ඩී.යූ.එම්.ප්‍රේමතිලක, එච්.ඒ.කේ. නදීකුමාරි. ආර්.එල්.ගමගේ, කේ.කේ.එම්.ප්‍රමෝදි. **පාපන්දු:** කේ.එම්.හයිම්, අයි.එස්. වීරක්කොඩි, එම්.එන්.එම්. නශාත්, *ජී.ඩබ්.එස්.සී. ගින්තොට. **හොකී:** එම්.ජී.ටී. පියුමන්ත; **(කා)** -ඩී.එම්. වීරසිංහ, * ඩබ්.සී.ඊ.වික්‍රමසිංහ. **කරාටේ: (පි)** කේ.ඩී.පී.සමරවීර, ආර්.එම්.එස්.ටී. සිරිවර්ධන, * අයි.ඒ.ඩී.කේ.සී.ඩබ්. ගුණරත්න **පිහිනුම්: (පි)** එස්.එස්.විතානගේ, ජී.එච්.සී.ඊ. කරුණාරත්න, ජේ.එම්.අයි.ඩී. ජයසුන්දර. **ටයිකොන්ඩෝ: (පි)** - * ඩබ්.ඒ.එම්.එස්. වීරසූරිය. **ටෙනිස්: (පි)** -ඊ.කේ. ද සිල්වා **(කා)**- ඊ.ඩබ්.එම්.යූ.අයි. පිටවල, කේ.එච්.එස්. රූපසිංහ. **වොලිබෝල් (පි)** -* වයි.එම්.කේ.කේ.යාපාරත්න

**උපාධි ප්‍රදානෝත්සවය**

උපාධි වැඩසටහන් 4ක සිසුන් 247දෙනෙකු සඳහා වූ උපාධි ප්‍රදානෝත්සවය 2015 ජූලි 20වන දින පවත්වන ලදී. උසස් පෙළ ඕනෑම විෂය ධාරාවකින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරා ගනු ලබයි. ( වගුව 3 අ සහ 3ආ) මෙම සිසුන්ගේ විෂය ධාරාව අනුව කාර්යසාධනය වගුව 3 මගින් දක්වා ඇත.

සිව්වන සහ තෙවන වසර සඳහා උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු අනුපිළිවෙලින් මාස 7කට සහ මාස 10කට පසුව සමීක්ෂණයක් ද අමාත්‍යාංශය විසින් උපාධි ප්‍රදානෝත්සවය කාලය අතරතුර පවත්වන ලදී. එම සමීක්ෂණයේ තොරතුරු මෙම වාර්තාවේ ඇතුළත් කිරීම පිණිස මෙතෙක් ලැබී නොමැත.

වගුව 3 : කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සිසුන්ගේ කාර්යසාධනය

| ඇතුළත් කර ගැනීම | පළමු පෙළ | දෙ. පෙළ ඉහළ | දෙවන පෙළ පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| ප.වි උපාධිය | 02 | 01 | 17 | 83 | 103 |
| තො.ස.තා උපාධිය | - | - | 15 | 38 | 53 |
| ප.වි විද්‍යාවේදී | 10 | 14 | 10 | 05 | 39 |
| තො.ස.තා විද්‍යාවේදී | 04 | 12 | 03 | 01 | 20 |
| එකතුව | 16 | 27 | 45 | 126 | 215 |

වගුව 3අ : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිලිබඳ උපාධි වැඩසටහනේ සිසුන්ගේ කාර්යධානය

| ඇතුළත් කර ගැනීම | පළමු පෙළ | දෙවන පෙළ ඉහළ | දෙවන පෙළ පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| ගණිත | - | - | 08 | 16 | 24 |
| ජීව විද්‍යා | - | - | 03 | 03 | 06 |
| වාණිජ්‍ය | - | - | 04 | 14 | 18 |
| කලා | - | - | - | 05 | 05 |
| තො.ස.තා උපාධිය | - | - | 15 | 38 | 53 |

වගුව 3ආ: තො.ස.තා විද්‍යාවේදී උපාධි වැඩසටහනේ සිසුන්ගේ කාර්යසාධනය

| ඇතුළත් කර ගැනීම | පළමු පෙළ | දෙවන පෙළ ඉහළ. | දෙවන පෙළ පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| ගණිත | 0 | 10 | 0 | 0 | 14 |
| ජීව විද්‍යා | 3 | 1 | 0 | 0 | 04 |
| වාණිජ්‍ය | 8 | 1 | 0 | 0 | 09 |
| කලා | 0 | 0 | 0 | 0 | 00 |
| තො.ස.තා විද්‍යාවේදී | 11 | 12 | 0 | 0 | 23 |

### ප්‍රථම උපාධි සම්මාන

ප්‍රථම උපාධි උපාධිප්‍රදානෝත්සවය 2014 ජූනි මස 10දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. 2013 වර්ෂයේ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ හොඳම ශිෂ්‍යයාට පිරිනැමෙන මහාචාර්ය වී.කේ. සමරනායක පදක්කම එම්.ජී.ඩී.කේ ප්‍රනාන්දු මෙනවියට පිරිනමන ලදී. අනෙකුත් ප්‍රථම උපාධි සම්මාන පහත පරිදි වේ:

වගුව 3 ඇ : පරිගණක විද්‍යාව: ප්‍රථම උපාධි සම්මාන -2014

| පදක්කමේ නම | පදක්කම්ලාභියාගේ නම |
|---|---|
| පරිගණක විද්‍යාව සඳහා මහාචාර්ය මොහාන් මුණසිංහ සම්මානය -2013 | සී. පන්කජන් |
| අවසන් වසර හොඳම පරිගණක විද්‍යා ව්‍යාපෘතිය සඳහා සින්ටෙක් සම්මානය -2013 | එම්.ජේ.එම්. ෂාසන් |
| කාර්මික පුහුණුවේ හොඳම කාර්යසාධනය සඳහා පිරිනැමෙන ඩේවිඩ් පීරිස් රන් පදක්කම (ප.වි) 2012 | ඩබ්.එල්.රණවීර<br>එම්.ජේ.එන්.ෂාසන්<br>එඩ්.ඒ.ඒ.එම්. වීරසිංහ<br>ඩබ්.ඩී.එන්.වයි. ගුණතිලක |
| තුන් අවුරුදු උපාධියේ දී (ප.වි) හොඳම කාර්යසාධනය සඳහා වර්තුසා අධ්‍යයන විශිෂ්ටතා සම්මානය -2013 | ටී.එම්.ගමලත් |

වගුව 3 ඇ : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය -ප්‍රථම උපාධි සම්මාන -2014

| පදක්කමේ නම | පදක්කම්ලාභියාගේ නම |
|---|---|
| සිව් අවුරුදු උපාධියේ දී (තො.ස.තා) හොඳම කාර්යසාධනය සඳහා IFS අධ්‍යයන විශිෂ්ටතා සම්මානය -2013 | එච්.ඩී.එස්.ටී. විජේරත්න |
| හොඳම අවසන් වසර ව්‍යාපෘතිය සඳහා සම්පත් බැංකු සම්මානය -2013 | එච්.ඩී.එස්.ටී. විජේරත්න<br>ජී.බී.අයි. ද සිල්වා |
| කාර්මික පුහුණුවේ හොඳම කාර්යසාධනය සඳහා පිරිනැමෙන ඩේවිඩ් පීරිස් රන් පදක්කම(තො.ස.තා) -2012 | එම්.ඒ.ආර්. ජල්ඩීන් |
| කාර්මික පුහුණුවේ හොඳම කාර්යසාධනය සඳහා පිරිනැමෙන ඩේවිඩ් පීරිස් රන් පදක්කම(තො.ස.තා) -2013 | ආර්.පී.එච්. විතානගේ |
| තුන් අවුරුදු උපාධියේ දී (තො.ස.තා) හොඳම කාර්යසාධනය සඳහා මොටරෝලා අධ්‍යයන විශිෂ්ටතා සම්මානය -2013 | ටී.ජී.ටී. පෙරේරා |

### පශ්චාත් උපාධි අධ්‍යාපනය

පරිගණනය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ ඒ සමාන සුදුසුකම් ඇති උපාධිධාරීන් සහ වෙනත් ක්ෂේත්‍රවල නිරතවන්නන් සඳහා තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහන සැලසුම් කර ඇත. තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහන තුළ විද්‍යුත් ඉගෙනුම ( e-learning) සහ බහු මාධ්‍ය යන ක්ෂේත්‍ර අන්තර්ගතය. තොරතුරු ආරක්ෂණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ගැනීමට අපේක්ෂා කරන උපාධිධාරීන් සඳහා තොරතුරු ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධිය සැලසුම් කර ඇත. මෙම වැඩසටහන තොරතුරු තාක්ෂණය, තොරතුරු පද්ධති විගණනය, සහ තොරතුරු ආරක්ෂණය යන ක්ෂේත්‍රයන්හි සේවය කරන පුද්ගලයන් සඳහා මධ්‍ය-වෘත්තීය අවස්ථා සපයනු ලබයි.

පරිගණක අධ්‍යයනායතනය මගින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන වසර දෙකක අර්ධ කාලීන වැඩසටහනක් වන අතර සමාසික 4ක කාල පරිච්ඡේදයකින් යුක්ත වෙයි. තෝරා ගැනීමේ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ පවත්වා 2015 /2016 වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම වසර තුළ දී ආරම්භ කරන ලදී. සිසුන් 2016 වර්ෂයේ දී පාඨමාලාව ආරම්භ කිරීම සඳහා ලියාපදිංචි කර ගනු ඇත.

වැඩසටහන සඳහා අභ්‍යන්තර සහ බාහිර කථිකාචාර්යවරුන් 37ක් දායකත්වය දැක්විය. පශ්චාත් උපාධි වැඩසටහන සඳහා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 452ක් විය ( වගුව 4). පශ්චාත් උපාධි වැඩසටහන මගින් උපයා ගන්නා ආදායම සැළකිය යුතු අන්දමකින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ උත්පාදිත අරමුල සඳහා දායක වන අතර යටිතල පහසුකම් සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්වීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තොරතුරු ආරක්ෂණය පශ්චාත් උපාධි (MIS)

විෂයමාලා වැඩමුළුව අප්‍රියෙල් මස 16 සහ 17 යන දිනයන්හි ද තවත් වැඩමුළුවක් සැප්තැම්බර් මස 23 සහ 24 යන දිනයන්හි ද පවත්වන ලදී. දර්ශනපති / දර්ශන විශාරද (MPhil /PhD) අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා ද වැඩමුළුවක් පවත්වන ලදී.

2000 වර්ෂයේ සිට පිරිනමනු ලබන තොරතුරු තාක්ෂණ වැඩසටහන සඳහා සිසුන් 218දෙනෙකු සිටින ලදී. 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන තොරතුරු ආරක්ෂණ වැඩසටහන සඳහා සිසුන් 53දෙනෙකු විය. පර්යේෂණ සිසුන් 51දෙනෙකු දර්ශනපති / දර්ශන විශාරද උපාධිය සඳහා වන පර්යේෂණ සිදු කරනු ලබයි. මෙම වසරේ උපාධි ලබා ගත් වැඩිම පර්යේෂණ සිසුන් සංඛ්‍යාව පර්යේෂණ කෙරෙහි යොදවා ඇති අවධානය කෙරෙහි සාක්ෂ්‍ය දරයි.

සිසුන් නවදෙනෙකු දර්ශනපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචිව සිටි අතර එක් ශිෂ්‍යයකු අර්ශන විශාරද උපාධිය සඳහා උත්ශ්‍රේණිගත වීමක් ලබා ගන්නා ලදී.

වගුව 4 : පශ්චාත් උපාධි වැඩසටහන් -2014

| පාඨමාලාව | 2014/2015 ලියාපදිංචිය | පළමු වසර සිසුන් | 2වන වසර සිසුන් | 3වන වසර සිසුන් | 4වන වසර සිසුන් | එකතුව | උපාධි ලබා ගත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යා පශ්චාත් උපාධිය | 83 | 86 | 81 | 4 | 10 | 181 | 42 |
| තො.තා පශ්චාත් උපාධිය | 75 | 76 | 100 | 19 | 23 | 218 | 46 |
| තො.ආරක්ෂණය විද්‍යාපති උපාධිය | 27 | 26 | 27 | - | - | 53 | 12 |
| පරිගණක විද්‍යා දර්ශන විශාරද උපාධිය | - | - | - | - | - | - | 04 |
| තො.තා දර්ශන විශාරද උපාධිය | - | - | - | - | - | - | 02 |
| තො.ආරක්ෂණය ආචාර්ය උපාධිය | - | - | - | - | - | - | 01 |
| **( Taught PhD)** | **185** | **188** | **208** | **23** | **33** | **452** | **107** |
| ආචාර්ය උපාධි | 01 | 01 | 07 | 01 | - | 09 | 42 |
| දර්ශනපති | 08 | 08 | 07 | 08 | 19 | 42 | 46 |
| **එකතුව** | **194** | **197** | **222** | **32** | **52** | **503** | **12** |

සියලු පාඨමාලා ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන ලදී.

**සම්මාන**

පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය දෙසැම්බර් 1-2 දිනවල බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දි පවත්වන ලදී. පරිගණක විද්‍යා පශ්චාත් උපාධි වැඩසටහනේ හොඳම සිසුවා සඳහා වන " Kingslake" සම්මානය සී.බී.ඉන්දිසූරිය මහතාට පිරිනමන ලද අතර තොරතුරු තාක්ෂණ හොඳම සිසුවාට පිරිනමන "ජයිකා" සම්මානය එච්.එම්. කොතලාවල මෙනවියට පිරිනමන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ත්‍යාගය පිරිනැමුවේ නැත. එක් ආචාර්ය උපාධිධාරියකු ද ඇතුළත්ව පර්යේෂණ සිසුන් සිව්දෙනෙකු උපාධි ලබා ගන්නා ලදී. 101දෙනෙකු පශ්චාත් උපාධි සම්පූර්ණ කරන ලද අතර 20දෙනෙකු පශ්චාත් උපාධි ඩිප්ලෝමා තෝරා ගන්නා ලදී.

**බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා**

වසර තුළ දී තොරතුරු තාක්ෂණය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රවීණතා පරීක්ෂණය (UCTIT) සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශ්වවිද්‍යාල පරීක්ෂණය ( UTEL) සඳහා සිසුන් 10,995ක් සහ 5,283ක් අනුපිළිවෙලින් පෙනී සිටින ලදී. වසර තුළ දී විද්‍යුත් අධ්‍යාපනය(e-Learning) පිළිබඳ මධ්‍යස්ථානය "KPMG" සිසුන් 300ක් සහ "CAA" සිසුන් 6ක් සඳහා මාර්ගගත පරීක්ෂණ පවත්වන ලදී.

තොරතුරු තාක්ෂණ උපාධිය (BIT) එහි ආරම්භයේ සිට තනිව සිසුන් 33,451දෙනෙකු ආකර්ෂණය කරගෙන ඇති අතර උපාධිධාරීන් 1,661ක්, උසස් ඩිප්ලෝමාධාරීන් 3,353ක් සහ ඩිප්ලෝමාධාරීන් 6,852ක් බිහි කර ඇත. 2014/15 වර්ෂයේ නව ලියාපදිංචිවීම් 1890ක් සහ ඉහළම උපාධිධාරී නිමැවුම වාර්තා කරන ලදී. (වගුව 5). නව ඇතුළත් කරගැනීම් සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය වසර තුළ දි සිදුකරන ලද නමුත් 2015 උසස් පෙළ සිසුන්සඳහා සේවය ලබා දීම සඳහා අධ්‍යයන වර්ෂය 2016 ජනවාරි මස අරඹනු ඇත.

වගුව 5 : බාහිර උපාධි පාඨමාලා 2014/15

| පාඨමාලාව | ඇතුළත් කර ගැනීම | පළමු වසර සිසුන් | 2වන වසර සිසුන් | 3වන වසර සිසුන් | එකතුව | උපාධි ලබා ගත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව | 1890 | 2621 | 1110 | 344 | 4075 | 334 |
| තො.තා උසස් ඩිප්ලෝමාව | 690 | 1110 | 406 | 993 | 2509 | 226 |
| තොරතුරු තාක්ෂණ උපාධිය | 346 | 344 | 649 | 658 | 1651 | 262 |
| **එකතුව** | **2926** | **4075** | **2165** | **1995** | **8235** | **822** |

වගුව 6 ලියාපදිංචි වූ සිසුන් සහ උපාධි ලබා ගත් සිසුන් සංඛ්‍යාව ද සමඟ පසුගිය වසර තුන පුරා තොරතුරු තාක්ෂණ උපාධි සිසුන්ගේ කාර්යසාධනය පෙන්නුම් කරයි.

විෂයමාලා වෙනස්කම් පිළිබඳව කෙටියෙන් පැහැදිළි කිරීමට සහ ආයතනයේ ප්‍රතිචාරය ලබා ගැනීම සඳහා BIT ආයතන රැස්වීම මැයි 20වන දින පැවැත්විණි. තොරතුරු තාක්ෂණ උපාධි ( BIT) විභාග කොළඹ, මහනුවර, ගාල්ල, යාපනය යන නගරවල පවත්වන ලදී. ධර්මපාල මාවතේ පිහිටි තොරතුරු තාක්ෂණ බාහිර උපාධි ( BIT) මධ්‍යස්ථානය නොවැම්බර් මස හිමිකරුවන්ට භාර දෙන ලදී. වර්තමානයේ දී කාර්යාලය පරිගණක විද්‍යායතනය තුළ පිහිටුවා ඇති අතර නව ස්ථානයක් සොයා බලනු ලැබේ. තොරතුරු තාක්ෂණ උපාධි ( BIT) ආයතන පරීක්ෂකවරුන් BIT ව්‍යාපෘතිවල ගුණාත්මය ඉහළ නැංවීම සඳහා පුහුණු කර ඇත.

වගුව 6 : පසුගිය වසර තුන තුළ බාහිර උපාධි කාර්යසාධනය

| බාහිර ප්‍රථම උපාධිධාරීන් | ප්‍ර. කාස. ද. (KPI) | 2012/2013 | 2013/2014 | 2014/2015 |
|---|---|---|---|---|
| තො.තා ඩිප්. -නව ඇතුළත් කර ගැනීම | 2000 | 2034 | 2379 | 1890 |
| තො.තා.ඩිප්. -ලියාපදිංචි වූ | 4000 | 4175 | 4535 | 4045 |
| තො.තා.ඩිප්. -ඩිප්ලෝමාධාරී | 600 | 611 | 515 | 334 |
| තො.තා.උ.ඩිප්.- ඇතුළත් කර ගැනීම | 600 | 714 | 721 | 690 |
| තො.තා.උ.ඩිප්.- ලියාපදිංචි වූ | 2000 | 2391 | 2583 | 2509 |
| තො.තා.උ.ඩිප්.- උසස් ඩිප්ලෝමාධාරීන් | 300 | 305 | 339 | 226 |
| තො.තා. උ. ( BIT) -ඇතුළත් කර ගැනීම | 300 | 312 | 347 | 346 |
| තො.තා. උ.- ( BIT) ලියාපදිංචි වූ | 1500 | 1416 | 1537 | 1651 |
| තො.තා. උ. - ( BIT) උපාධිධාරීන් | 200 | 194 | 225 | |

**උපාධි ප්‍රදානෝත්සවය**

2015 සැප්තැම්බර් 1දින පැවති 2014 උපාධි ප්‍රධානෝත්සවයට සහභාගී වූ උපාධිධාරීන්ගේ කාර්යසාධනය වගුව 7 මඟින් දක්වා ඇත. මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිධාරීන් 225ක් උපාධි ලබා ගන්නා ලදී. නව අධ්‍යයන වර්ෂය ජනවාරියේ සිට ආරම්භ කිරීම ද ඇතුළුව තොරතුරු තාක්ෂණ උපාධියට සිදු කිරීමට යෝජිත වෙනකස්කම් පිළිබඳව කෙටියෙන් පැහැදිළි කිරීම සඳහා තොරතුරු තාක්සණ ඉගැන්වීම් ආයතනය සමඟ රැස්වීමක් මැයි මස 29දින පවත්වන ලදී.

වගුව 7 : 2014 දී පැවති උපාධි ප්‍රදානෝත්සවයේ උපාධිධාරීන්

| ඇතුළත් කර ගැනීම | පළමු පන්තියේ සාමාර්ථ | දෙවන ඉහළ | දෙවන පහළ | සමත් | එකතුව |
|---|---|---|---|---|---|
| තො.තා. උපාධිය | 7 | 9 | 11 | 198 | 225 |

**සම්මාන**

තොරතුරු තාක්ෂණ බාහිර උපාධි පාඨමාලාවේ හොඳම කාර්යසාධනය වෙනුවෙන් පිරිනමනු ලබන මහාචාර්ය වී.කේ.සමරනායක පදක්කම එම්.එච්.වී.එම්.පී. විජේපාල මෙනවියට පිරිනමන ලදී. හොඳම කේවල ව්‍යාපෘතිය සඳහා එම්.නසීම් සඩික් මහතා. එම්.ජේ.පී.යූ සමන්තිලක අනුස්මරණ සම්මානය ජේ.ඒ.රොමේෂ් රාජා මහතාට පිරිනමන ලදී. සමාසික 4 සඳහා හොඳම විද්‍යුත් අධ්‍යාපනලාභීන් ( e-learner) සඳහා වන සම්මාන ටී.තනබාලසිංහම් මිය, ජ්.බී. අමරඩීන් මහතා, එච්.කේ.ආර්.කේ. සේනාධිර මහතා සහ කේ.එල්.එන්.ටී. අමරසේකර මහතා විසින් දිනා ගන්නා ලදී.

ආයතන

බොහෝ ආයතන තොරතුරු තාක්ෂණ උපාධි අපේක්ෂකයන් සඳහා අභිමුඛ පන්ති සහ ඉගෙනුම් සහාය ලබා දී ඇත. මෙම ක්‍රියාවලිය සඳහා ආයතන 200කට වැඩි ප්‍රමාණයක් සහභාගී වී ඇති අතර ආයතන 50ක් පමණ ඇතැම් අධ්‍යයන වර්ෂවල දී පමණක් දායක විය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය කිසිවක් පිළිබඳ පිළිගැනීමක් ලබා නොදෙන නමුත් වැඩසටහනේ සාර්ථකත්වය උදෙසා ඔවුන්ගේ දායකත්වය හඳුනාගෙන ඇත. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් සෑම වසරකම ආයතනය අනුව විභාග ප්‍රතිඵල සාරාංශයක් පළ කරනු ලබන අතර එනයින් අපේක්ෂකයන්ට පවතින ආයතන හඳුනාගෙන තම ඉගෙනුම් ක්‍රමය සැලසුම් කර ගත හැකිය. අපේක්ෂකයන් අධිකව වැඩි ප්‍රමාණයක් තථ්‍ය ඉගෙනුම් පරිසරය (Virtual Learning Environment) සහ මාර්ගගත /නිර්දේශිත පොත්පත් ආධාරයෙන් ස්වයං අධ්‍යයනයේ යෙදෙයි. 2014/2015 වර්ෂයේ දී, දිස්ත්‍රික්ක 12ක ආයතන 31ක් අපෙක්ෂකයන් පහකට හෝ වැඩි ප්‍රමාණයකට පුහුණුව ලබා දෙන ලදී. ඒවා අතරින් ආයතන 14ක් වසර තුන සඳහාම මේ සඳහා යෙදී සිටින ලදී. ( වගුව 8 හි * යොදා ඇත).

වගුව 8 : තොරතුරු තාක්ෂණ උපාධි වැඩසටහනෙහි (BIT) නිරතව සිටින ආයතන

| දිස්ත්‍රික්කය | ආයතනය |
|---|---|
| අම්පාර | (1) Global Institute of Professional Education |
| මඩකලපුව | (2) * ESOFT පරිගණක අධ්‍යයනායතනය |
| කොළඹ | (1) * Aurora පරිගණක අධ්‍යයනායතනය,මහරගම<br>(2) *E-Academy, කොළඹ 06<br>(3) *Earth International, කොළඹ 08<br>(4) Easl J Lanka පරිගණක පුහුණු ආයතනය, කොළඹ 08<br>(5) * ESOFT පරිගණක අධ්‍යයනායතනය, කොළඹ 04<br>(6) ESOFT පරිගණක අධ්‍යයනායතනය, කොළඹ 06<br>(7) ESOFT පරිගණක අධ්‍යයනායතනය, නුගේගොඩ<br>(8) Foundation of IT Professionals, පන්නිපිටිය<br>(9) Foundation of IT Professionals, කොළඹ 08<br>(10) * IDM පරිගණක අධ්‍යයනායතනය, කොළඹ<br>(11) *Matrix Institute of IT, කොළඹ 04<br>(12* Openarc School of Business and Technology, කොළඹ 06<br>(13) *Widewake Solutions, පැපිළියාන |
| ගාල්ල | (1) ESOFT පරිගණක අධ්‍යයනායතනය |
| ගම්පහ | (1) Earth International<br>(2) ESOFT පරිගණක අධ්‍යයනායතනය, ගම්පහ<br>(3) ESOFT පරිගණක අධ්‍යයනායතනය, කිරිබත්ගොඩ<br>(4) ESOFT පරිගණක අධ්‍යයනායතනය, මීගමුව |
| යාපනය | (1) ESOFT පරිගණක අධ්‍යයනායතනය<br>(2) * MIS BIT Campus<br>(3) Mobile @ Net Computer Services |
| නුවර | (1) * ESOFT පරිගණක අධ්‍යයනායතනය |
| කෑගල්ල | (1) Institute of Computer Studies |
| කුරුණෑගල | (1) *ESOFT පරිගණක අධ්‍යයනායතනය |
| මාතර | (1) Dbase School of Computing<br>(2) ESOFT පරිගණක අධ්‍යයනායතනය<br>(3) IDM පරිගණක අධ්‍යයනායතනය |
| රත්නපුර | (1) ITsoft පරිගණක අධ්‍යයනායතනය, බලංගොඩ |
| ත්‍රිකුණාමලය | (1) ESOFT පරිගණක අධ්‍යයනායතනය |

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විස්තාරිත සහතිකපත් පාඨමාලා නවයක් පිරිනමන ලද අතර සිසුන් 300කට වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්නා ලදී. වගුව 9 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය පරිගණක විද්‍යා සහතිකපත් පාඨමාලා (වැඩසටහන්) දක්වයි. ( D - කාලය දින ;B කණ්ඩායම් ගණන; P සහභාගී වූවන්ගේ එකතුව )

වගුව 9 : පරිගණක විද්‍යා සහතිකපත් පුහුණු වැඩසටහන්

| පාඨමාලාව | 2014 | D | B | P |
|---|---|---|---|---|
| JavaSE භාවිත කරමින් ජාවා යෙදවුම් සංවර්ධනය | 89 | 8 | 3 | 71 |
| උසස් ජාවා යෙදවුම් සංවර්ධනය | 67 | 8 | 2 | 44 |
| Unix/Linux ජාල සහ පද්ධති පරිපාලනය | 71 | 5 | 3 | 78 |
| උසස් බහු මාධ්‍ය වෙබ් සැලසුම්කරණ සහ සංවර්ධන ශිල්පක්‍රම | 39 | 8 | 1 | 12 |
| AutoCAD2010 භාවිත කරමින් පරිගණක ආශ්‍රිත සැලසුම් කිරීම | 18 | 8 | - | - |
| ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංගය | 24 | 2 | - | - |
| PHP සහ MySQL සමඟ වේගවත් වෙබ් යෙදවුම් සංවර්ධනය | 7 | 8 | 1 | 18 |
| පරිගණක වදන් සැකසුම සහ පරිගණක ආධාර කරගත් පරිවර්තන මෙවලම් | - | 3 | 1 | 25 |
| Ms Office පුහුණු පාඨමාලාව | - | 6 | 1 | 14 |
| ඇන්ඩ්‍රොයිඩ් යෙදවුම් සංවර්ධනය | - | 8 | 2 | 37 |
| වෘත්තිය සංවර්ධනය සඳහා පරිගණනය | - | 12 | 1 | 40 |
| **එකතුව** | **389** | **47** | **18** | **339** |

**විදේශීය සිසුන්**

කලාපයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් වශයෙන් පිළි ගනු ලැබීම සඳහා විදේශ සිසුන් ආකර්ෂණය කර ගැනීම වැදගත්ය. කාලයක් පුරා ශිෂ්‍යයන් ලියාපදිංචි කර ගැනීම සඳහා විදේශීය කාණ්ඩය පැවැතිය ද මේ දක්වා අයදුම් කර ඇත්තේ වෙනත් රටකින් උසස් පෙළ හැදෑරූ දේශීය සම්භවයක් සහිත සිසුන් පමණි. 2011 වර්ෂයේ දී විදේශීය කාණ්ඩය යටතේ ප්‍රථම ශිෂ්‍යයා පරිගණක විද්‍යා උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි විය. 2013 වර්ෂයේ දී භූතානයෙන් ප්‍රථම විදේශීය ශිෂ්‍යයා තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා ඇතුළත් වූ අතර අනතුරුව විදේශීය ශිෂ්‍යයෙක් තොරතුරු ආරක්ෂණය විද්‍යාපති උපාධිය සඳහා පකිස්ථානයෙන් පැමිණිය ද පළමු සමාසිකයෙන් පසු පාඨමාලාවෙන් ඉවත් විය. මෙම වර්ෂයේ දී නයිජීරියානු ශිෂ්‍යයකු වැඩසටහන හා සම්බන්ධ විය. විදේශ ශිෂ්‍යයන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු වගුව 10හි දැක්වේ.

වගුව 10: විදේශීය ශිෂ්‍යයන්

| පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් කර ගැනීම | පළමු වසර සිසුන් | 2වන වසර සිසුන් | 3වන වසර සිසුන් | 4වන වසර සිසුන් | උපාධිය ලබා ගත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| පරි. විද්‍යාව | ඉංග්‍රීසි | - | - | - | 01* | - | - |
| තො.තා.පශ්චාත් උපාධිය | ඉංග්‍රීසි | 01 | 01 | 01 | - | - | - |

* 2015 වර්ෂයේ දී උපාධිය ලබා ගන්නා ලදී.

**ආරම්භ කරන ලද නව පාඨමාලා**

සියලුම ප්‍රථම උපාධි වැඩසටහන් ACM/IEEE මාර්ගෝපදේශ හා අනුකූල වීම සඳහා පෙළ ගැස්වීම හා අදාළ අධ්‍යයන වර්ෂ වෙනස්වීම් සිදු කරන ලදී. නව මෘදුකාංග ඉංජිනේරු විද්‍යා පාඨමාලාව වසර 3ක් සඳහා ආරම්භ කරන ලදී. උපාධියක් සඳහා යොමු කරන නව සහතිකපත් පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය (FITIS) අතරද තොරතුරු තාක්ෂණයේ ජාත්‍යන්තර ප්‍රවීණතා (ICIT) පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ජාතික මාර්ගගත දූරස්ථ අධ්‍යාපන සේවය (NODES) සහ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය අතර ද අත්සන් කරන ලදී.

මෙම වැඩසටහන 2015 වර්ෂයේ දී ආරම්භ කිරීමට අපේක්ෂා කළ නමුත් ඇතැම් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ විරෝධතා හේතුවෙන් මෙම යෝජනාව ඉවත් කර ගන්නා ලදී. කෙසේ නමුත් පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC) මඟින් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා නව සහතිකපත් පාඨමාලා පිරිනමන ලදී.

වගුව 11- නව පාඨමාලා

| පාඨමාලාව | මාධ්‍යය | සහතිකපත් | උපාධි | ප.උ.ඩිප්ලෝමා | පශ්.උපාධි | දර්ශනපති | ආචාර්ය උ. |
|---|---|---|---|---|---|---|---|
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | ඉංග්‍රීසි | - | 1 | - | - | - | - |
| සහතිකපත් පාඨමාලා | ඉංග්‍රීසි | 4 | - | - | - | - | - |

## පර්යේෂණ

### පර්යේෂණ, නවෝත්පාදන, සහ ප්‍රකාශන

විවිධ පර්යේෂණ කණ්ඩායම් යටතේ සහ පර්යේෂණ සිසුන් හරහා පර්යේෂණ සිදු කරනු ලබයි (වගුව 13). කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ප්‍රධාන වශයෙන් දැනට ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘති කේන්ද්‍ර කොට ගත් සිය පූර්ණ /අර්ධ කාලීන දර්ශනපති වැඩසටහන සඳහා පරිගණක විද්‍යාව/ ඉංජිනේරු විද්‍යාව ඉහළ ප්‍රතිඵල සහිත ප්‍රථම උපාධියක් හිමි උපාධිධාරීන් බඳවා ගනු ලැබේ. වර්ෂය තුළ දී නව සිසුන් 8දෙනෙක් දර්ශනපති උපාධිය සඳහා ද එක් ශිෂ්‍යයෙක් අචාර්ය උපාධිය සඳහා ලියාපදිංචි වී ඇත. වර්තමානයේ දී අධ්‍යයනායතනයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන් 16ක් සහ බාහිර පර්යේෂකයන් 10දෙනෙකු යටතේ ශිෂ්‍යයන් 51දෙනෙකු ක්ෂේත්‍ර 25ක කටයුතු කරනු ලබයි. මේ වන විට දර්ශනපති/ආචාර්ය උපාධිය සඳහා වූ පර්යේෂණ ව්‍යාපෘති 22ක් සම්පූර්ණ කර ඇත. දර්ශනපති/ආචාර්ය උපාධි සිසුන් 18දෙනෙකු වසර තුළ දී ප්‍රකාශන පළ කර ඇත.

බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ගිනිගේ සමාජ ජීවන ජාල පර්යේෂණ ව්‍යාපෘතිය (Social Life Network Research Project) සඳහා අප්‍රියෙල් සහ අගෝස්තු මස දින කිපයක් සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට පැමිණෙන ලදී. මෙම ව්‍යාපෘතිය 2016 අයවැය යෝජනාවලියෙහි නවෝත්පාදන ව්‍යාපෘතිවලින් එකක් ලෙස හඳුන්වා ඇත. කොළඹ නගර සභාව සඳහා වූ ඩෙංගු ව්‍යාපෘතිය සඳහා සිංගප්පූරුවේ " Nanyang" තාක්ෂණික විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක් ද කොළඹට පැමිණෙන ලදී.

වගුව 12 : කාර්යමණ්ඩල පර්යේෂණ ක්ෂේත්‍ර

| පර්යේෂණ ක්ෂේත්‍රය | පූර්ණ කාලීන | අර්ධ කාලීන | එකතුව | නව | සම්පූර්ණ |
|---|---|---|---|---|---|
| කෘත්‍රිම බුද්ධිය | 1 | 2 | 3 | 0 | 0 |
| උපකාරක තාක්ෂණය | 0 | 1 | 1 | 1 | 0 |
| පරිගණක චිත්‍රක | 1 | 1 | 2 | 0 | 1 |
| පරිගණක විද්‍යාව | 0 | 1 | 1 | 0 | 0 |
| පරිගණක දැක්ම | 1 | 0 | 1 | 1 | 0 |
| දත්ත කැණීම ( Data Mining) | 1 | 0 | 1 | 0 | 0 |
| දත්ත අර්ථ විචාරය (Data Semantics) | 2 | 0 | 2 | 0 | 0 |
| ඩිජිටල් අධිකරණ වෛද්‍ය විද්‍යාව | 1 | 0 | 1 | 0 | 0 |
| විද්‍යුත් ඉගෙනුම | 2 | 5 | 7 | 1 | 0 |
| ක්‍රීඩා පදනම් කරගත් ඉගෙනුම | 0 | 1 | 1 | 0 | 0 |
| භූගෝලීය තොරතුරු පද්ධති | 1 | 1 | 2 | 0 | 1 |
| හරිත තොරතුරු තාක්ෂණය | 1 | 0 | 1 | 0 | 0 |
| සවයංගවේෂණ ප්‍රශස්තකරණය | 0 | 1 | 1 | 0 | 0 |
| ඉහළ කාර්යසාධනය | 0 | 1 | 1 | 1 | 0 |
| ප්‍රතිබිම්භ සැකසීම | 0 | 2 | 2 | 1 | 1 |
| තොරතුරු පද්ධති | 3 | 0 | 3 | 1 | 0 |
| දැනුම ඉංජිනේරු විද්‍යාව | 1 | 1 | 2 | 1 | 0 |
| යන්ත්‍ර ඉගෙනුම | 2 | 0 | 2 | 1 | 0 |
| ජංගම දූරකථන මඟින් ඉගෙනුම | 1 | 0 | 1 | 0 | 0 |
| බහුමාධ්‍ය | 1 | 2 | 3 | 0 | 0 |
| ස්වාභාවික භාෂා සැකසීම | 2 | 1 | 3 | 0 | 0 |
| ස්නායුක ජාල | 0 | 1 | 1 | 0 | 0 |
| සංවේදක ජාල | 0 | 2 | 2 | 0 | 1 |
| සමාජ විද්‍යාව හා තොරතුරු තාක්ෂණය | 0 | 3 | 3 | 0 | 0 |
| මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව | 2 | 2 | 4 | 1 | 0 |
| එකතුව | **23** | **28** | **51** | **09** | **04** |

අධ්‍යයනායතනයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා 2009 වර්ෂයේ දී ප්‍රයෝජ්‍යකරණ මාර්ගෝපදේශ සමඟ පර්යේෂණ අරමුදලක් ස්ථාපනය කරන ලදී. පශ්චාත් උපාධි සහ තොරතුරු තාක්ෂණ උපාධියෙන් ලද රු. මිලියන 4ක මූලික දායකත්වයේ සිට මෙම අරමුදල උත්පාදිත ආදායම සමඟ අඛණ්ඩව වර්ධනය වූ අතර මේ වන විට රු.මිලියන 100ක් දක්වා වර්ධනය වී ඇත. ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලවලට පර්යේෂණ රැස්වීම් සඳහා සහභාගී වීමට සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සඟරාවල පර්යේෂණ පළ කිරීමට වාර්ෂිකව අනුපිළිවෙලින් රු..350,000/- සහ

250,000 දක්වා භාවිත කළ හැකිය. මෙය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික ප්‍රකාශන සංඛ්‍යාව තිස් ගණන් සිට හැට ගණනක් දක්වා ඉහළ නැංවීය. මෙම වර්ෂයේ ප්‍රකාශන අතර 54ක් රටවල් 12ක පැවැති පර්යේෂණ පත්‍රිකා විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 23දෙනෙකු (58%) ක් පර්යේෂණ පත්‍රිකා පළ කර ඇත. වගුව 13 ප්‍රකාශනවල තොරතුරු දක්වයි.

පහත කාර්ය මණ්ඩලයේ සම කර්තෘක පත්‍රිකා 123ක් ප්‍රකාශන තුළ අන්තර්ගතය: ජී.එන්. වික්‍රමනායක (12).කේ.පී. හේවාගමගේ (11), ජී.කේ.ඒ ඩයස් ( 9), ඩී.ඒ.එස්. අතුකෝරාල (7), කේ.එල්. ජයරත්න ( 6), එන්.ඩී.කොඩිකාර (6), ඒ.ආර්. වීරසිංහ ( 6), කේ.ටී.ඒන්. ද සොයිසා ( 5), සී.අයි. කැප්පෙටියාගම (5), ඩී.ඩී.කරුණාරත්න (3), ජී.ඩී.එස්.පී. විමලරත්න (3), වයි.ඒකනායක (3), එස්.පී.මාතරආරච්චි ( 2), එච්.එල්. ප්‍රේමරත්න (2), ආර්.එම්.පී.එන්. සෝමරත්න (2), එච්.ඒ.කල්දේරා (1), කේ.කේ.කේ. ධර්මතිලක (1), එච්.බී. ඒකනායක ( 1), එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු (1), ජේ.එස්.ගුණතිලක (1), ටී.සී.හල්ලෝලුව (1), ආර්.එස්.මදනායක ( 1), එස්.ටී.නන්දසාර (1), හකීම් යූසොෆ් (1), ටී.ඒ. වීරසිංහ ( 1)

වගුව 13: පර්යේෂණ සාරාංශය

| විෂය | ප්‍රකාශිත | වාණිජ්‍යකරණය කරන ලද | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | 123 | - | 54 |
| නවෝත්පාදන සංඛ්‍යාව | - | - | - |
| සඟරා සංඛ්‍යාව | 17 | - | - |
| නිබන්ධන සංඛ්‍යාව | 2 | - | - |
| ලිපි සංඛ්‍යාව | 52 | - | - |
| වෙනත් | - | - | - |
| එකතුව | **71** | - | **54** |

## සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළු

අදාළ ව්‍යාපෘති හඳුනා ගැනීම සහ සිදු කරගෙන යාම සඳහා යාන්ත්‍රණ ඇති කිරීම කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ තවත් ක්‍රමෝපායයකි. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ හත්වන පර්යේෂණ පරිසංවාදය අවසන් වසර සිසුන්ගේ සහභාගීත්වයෙන් 2015 අප්‍රියෙල් මස 29වන දින පවත්වන ලදී. ආයතනය ICTer සඟරාවේ ලිපි පළ කරන ලදී. ආයතනය විසින් සංවිධානය කරන ලද මතුවන කලාප සඳහා අන්තර්ජාතික තොරතුරු තාක්ෂණ සම්මේලනය 2015 අගෝස්තු 24-26 දක්වා පවත්වන ලද අතර අගෝස්තු 26වන දින පශ්චාත් සම්මේලන වැඩමුළුවක් ද පවත්වන ලදී. Ubi-Media Computing ( UMEDIA2015) පිළිබඳ 8වන ජාත්‍යන්තර සම්මේලනය සමඟ එක්ව ICTer සම්මේලනය පවත්වන ලදී. සිව්වන වසර සිසුන්ට අය කිරීමකින් තොරව සම්මේලනය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දුන් අතර එහි වියදම රු.435,000 කි. එයට අමතරව, විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය දර්ශනපති/ ආචාර්ය උපාධි සිසුන් සඳහා ද රු.60,000ක අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී. එක් විද්‍යාර්ථියකු සඳහා වන උපරිම අරමුදල් ප්‍රමාණය සීමා කිරීම සඳහා සියලු විද්‍යාර්ථීන් විසින් භාවිත කරන පර්යේෂණ අරමුදල් සඳහා වූ යාන්ත්‍රණය ද ආයතනය විසින් සංශෝධනය කරන ලදී. පර්යේෂණ ප්‍රදාන මෙම වර්ෂයේ දී පිරිනමනු ලැබුවේ නැත. ICTer සම්මේලනය විසින් ආකර්ෂණය කර ගන්නා ලද පර්යේෂණ පත්‍රිකා 130ක් සම්පූර්ණ පත්‍රිකා වශයෙන් ද 18ක් සාරාංශ වශයෙන් ද ආකර්ෂණය කර ගන්නා ලදී. ඒකාබද්ධ සම්මේලනය සඳහා විදේශීය සහභාගීන් 63දෙනෙකු සහභාගී විය.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මහාචාර්ය වී.කේ සමරනායක වාර්ෂික දේශනය සැප්තැම්බර් 9වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථක ලෙස පවත්වන ලදී. දේශක දේශමාන්‍ය එම්.ඩී.ඩී. පීරිස් මහතා “ ”තාක්ෂණික වෙනස සමඟ අධ්‍යාපනයේ ගුණාත්මය පිළිබඳ ගැටළු සහ විශ්වවිද්‍යාලවල වගකීම” මැයෙන් දේශනයක් පවත්වන ලදී. කාර්ය මණ්ඩල සහභාගීත්වය සමඟ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු වගුව 14හි දක්වා ඇත.

වගුව 14 : සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළු

| විෂය | සහභාගී වූ | ප්‍රකාශන ඉදිරිපත් කළ | ඉදිරිපත් කිරීම් සිදු කරන ලද |
|---|---|---|---|
| දේශීය සම්මේලන සඳහා ජොෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයන් | 20 | 5 | 1 |
| ජාත්‍යන්තර සම්මේලන සඳහා ජොෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයන් | 21 | 10 | 12 |
| සංවිධානය කරන ලද ජාත්‍යන්තර සම්මේලන (ICTer) | 290 | 74 | - |
| ICTer සඟරාව | 1 | 1 | - |
| එකතුව | 332 | 90 | 13 |

## ලබා ගත් සම්මාන

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සිසුන් ජාතික සහ ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී වීමට උනන්දු කරවිය. විද්‍යුත් සෞඛ්‍ය සහ අධ්‍යාපන හා පුහුණු කාණ්ඩවලදී "Run Tropica" ව්‍යාපෘතිය සඳහා ( මැලේසියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලය හා සහයෝගීත්වයෙන් සිදු කරන ලදී) සහ K-8 ගුවන්යානා උත්තේජකාරකය ( ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගීත්වයෙන් සිදු කරන ලදී) රන් හා ලෝකඩ සම්මාන දිනා ගැනීමට ආයතනයේ කාර්ය මණ්ඩලය සමත්විය. "sangeethalya.lk " සහ Run Tropica" ඉන්දියාවේ මන්තන් සම්මාන උළෙලේ දී විද්‍යුත් විනෝදාස්වාදය සහ ක්‍රීඩා, සහ විද්‍යුත් සෞඛ්‍යය යන කාණ්ඩ යටතේ සම්මාන දිනා ගන්නා ලදී. අමතරව, ඇතැම් කාර්ය මණ්ඩල සාමාජිකයන් ඔවුන්ගේ පර්යේෂණ සිදු කර ගෙන යාම සඳහා ජාතික විද්‍යා පදනමින් සහ ජාතික පර්යේෂණ මණ්ඩලයෙන් ප්‍රදාන ලබා ගන්නා ලදී. ලබා ගත් සම්මාන පිළිබඳව විස්තර 15 වගුව මඟින් දක්වා ඇත.

සිංගප්පූරුවේ "Nanyang" තාක්ෂණික විශ්වවිද්‍යාලයේ සහයෝගීත්වයෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ දී සංවර්ධනය කරන ලද " Mo-Buzz Dengue Mobile app" පෙබරවාරි 12වන දින කොළඹ මහනගර සභාවේ දී නැවත දියත් කරන ලදී. සිංගප්පූරුවේ "Nanyang" තාක්ෂණික විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක් විසින් අනතුරුව ප්‍රගතිය අධීක්ෂණයට සහ ක්‍රියාත්මක කිරීමේ ගැටළු සඳහා පසු විපරම් කරන ලදී. ගොවි නැණ කෘෂිකර්ම ව්‍යාපෘතිය නම් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ව්‍යාපෘතියක් ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයන ව්‍යාපෘතියකට වඩා ප්‍රමුඛ කිරීම කොට ජාතික මට්ටමට ගැනීමට රජයේ අයවැය මඟින් ක්‍රියා කරන ලදී. මෙම ව්‍යාපෘතිය බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ සහයෝගීත්වයෙන් සිදු කරන ලදී. යුරෝපා සංගම් මත්ස්‍ය තහනම ඉවත් කරවා ගැනීමේ පළමු යෙදවුම වශයෙන් තෝරා ගත් ධීවර බෝට්ටු සඳහා විද්‍යුත් ලොග් පොත නම් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ද රජය විසින් අනුමැතිය ලබා දී ඇත.

වගුව 15 : ලබා ගත් සම්මාන

| විෂය | ලබා ගත් සම්මාන සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමා. සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය සම්මාන | - | - | - |
| ජාතික සම්මාන | 2 | 2 | 3 |
| ජාත්‍යන්තර සම්මාන | 2 | 2 | 1 |
| වෙනත් | - | - | - |
| එකතුව | 4 | 4 | 4 |

## අධ්‍යයන කාර්ය මණ්ඩලය

2015 ජනවාරි මස පළමු දින දිගු කාලීන සේවය සඳහා වූ සම්මානය ජී.කේ.ඒ. ඩයස් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය, එම්.එස්.රාජපක්ෂ මිය - ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහකාර ( දත්ත නිවේශක), සහ එච්.ඒ.සුනිල් මහතා (කාර්යාල කාර්ය සහායක) යන අයට පිරිනමන ලදී. සුනිල් මහතා සහ ජී.ඩී.එල්.පී. ගුණරත්න මිය ( ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහකාර) විශ්වවිද්‍යාලය සඳහා දිගු කලක් සේවය කිරීමෙන් අනතුරුව සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. සේවක සංඛ්‍යා සමාලෝචන රැස්වීම පෙබරවාරි 25වන දින පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයට ඔවුන්ගේ වාර්තාව අපගේ වාර්තාව ද ඇතුළත් කරමින් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආයතනික සමාලෝචන රැස්වීම වසරේ පසු භාගයේ දී පවත්වන ලදී.

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (මාස 03) වර්ෂය තුළ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගන්නා ලදී. කර්මාන්තය තුළ ඇති ආකර්ෂණීය පාරිතෝෂිකයන් හේතුවෙන් ආයතනයට අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට නොහැකි විය. අධ්‍යයන සහ අධ්‍යයන සහයක ස්ථාන 86න් පිරවිය හැකි වූයේ 42ක් පමණි. පෞද්ගලික අංශයෙන් ලබා දෙන වඩා හොඳ ප්‍රතිලාභ හේතුවෙන් පුහුණු තාක්ෂණික නිලධාරීන් රඳවා ගැනීම සහ දක්ෂ තරුණ විද්‍යාර්ථීන් ආකර්ෂණය කර ගැනීම අතිශයින් අපහසු කරුණක් වී ඇත. ස්ථිර කාර්ය මණ්ඩලය හැරුණු කොට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය තොරතුරු පද්ධති උපාධි වැඩසටහනේ ඇතැම් පාඨමාලා ඉගැන්වීම සඳහා බාහිර කාර්ය මණ්ඩලය මත යැපේ. 2014 කොන්ත්‍රාත් සේවකයන් ස්ථිර කිරීමේ දින 180 නියමය හේතුවෙන් කොන්ත්‍රාත් සේවකයන් 15දෙනෙකු උසස්වීම් සඳහා සුදුසුකම් ලද අතර 2015 දෙසැම්බර් මස ස්ථිර කාර්ය මණ්ඩලයට පත්වන ලදී. පැවරුම් පදනම පත් කරන ලද සේවක පත්වීම් හයක් තවමත් සමාලෝචනය කරමින් පවතී.

ජාත්‍යන්තර මානව සම්පත් ආකර්ෂණය කර ගැනීම සඳහා වර්ෂය තුළ දී ඔස්ට්‍රේලියාවෙන් පැමිණි කෙටි කාලීන බාහිර පර්යේෂකයකු සඳහා පහසුකම් සපයන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු වගුව 16හි දක්වා ඇත.

වගුව 16: කාර්ය මණ්ඩල පර්යේෂණ වපසරිය

| විෂයය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | උපදේශක |
|---|---|---|---|---|---|---|---|
| පරිගණන(ස්) | ඉංග්‍රීසි | - | 03 | 21 | 14* | - | 02 |
| පරිගණන (කො ) | ඉංග්‍රීසි | - | - | 01 | - | 08 | 18 |

*දෙදෙනකු නිවාඩු ලබා ඇත.

**අනධ්‍යයන කාර්ය මණ්ඩලය: ස්ථිර (P) කොන්ත්‍රාත්/පැවරුම් (C/A)**

බාහිර සහ විස්තාරිත පාඨමාලා සහ පශ්චාද් උපාධි පාඨමාලා සඳහා වන මාර්ගගත ගෙවීම් පහසුකම අඛණ්ඩව සලස්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි මූල්‍ය පද්ධතිය වැඩිදියුණු කරන ලද අතර ආවේක්ෂණය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියක් සහ තීරු සංකේත පාදක කරගත් වත්කම් අධීක්ෂණ පද්ධතියක් ආරම්භ කරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර 17 වගුවේ දක්වා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි අනධ්‍යයන කාර්ය මණ්ඩලය 78ක් ලෙස අනුමතව පැවතියද ස්ථිර තනතුරු 37ක් පමණක් සම්පූර්ණ වී ඇති අතර වැඩවලින් වැඩි ප්‍රමාණයක් කොන්ත්‍රාත් සහ පැවරුම් කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය පාදක කොට ගෙන, කොන්ත්‍රාත් සේවා නියුක්තිකයන් 16 දෙනෙකු ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලබා ඇත.

17 වගුව : අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| වර්ගය | ජ්‍යෙෂ්ඨතම (පරිපාලන) | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවකයන් | ව්‍යාපෘති නිලධාරි මණ්ඩලය |
|---|---|---|---|---|---|
| ස්ථිර | 8 | 3 | 20 | 6 | - |
| කොන්ත්‍රාත් | - | 6 | 11 | 8 | 17 |
| පැවරුම් | - | 1 | 10 | 9 | 7 |

**කාර්ය මණ්ඩල පුහුණුව සහ විදේශ නිවාඩු**

මහාචාර්ය එන්.ඩී. කොඩිකාර (ජනවාරි 01 සිට) සහ ආචාර්ය ඒ.ආර්. වීරසිංහ (නොවැ. 01 සිට) යන අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් දෙදෙනා එක් වර්ෂයක් සඳහා සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත් අතර සප්ත වාර්ෂික නිවාඩු පිට සිටින එන්.ඩී. කොඩිකාර සැප්. 24 සිට ඔක්. 4 දක්වා ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න් වෙත සංචාරය කළේය.

ආචාර්ය එච්.ඒ. කල්දේරා (ඉතාලිය), ආචාර්ය එම්.ඩී.ආර්.එන්. දයාරත්න (ඉන්දියාව සහ මැලේසියාව), ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා (ඉන්දියාව), කේ.කේ.කේ. ධර්මතිලක මහතා (මැලේසියාව), ආචාර්ය යමායා ඒකනායක මහත්මිය (ඔස්ට්‍රේලියාව), එම්.පී.එන්.ඒ.එස්.ප්‍රනාන්දු මහතා (ඇ.එ.ජ.), ආචාර්ය ඩී.ඩී. කරුණාරත්න (තායිලන්තය), ටී.ඒ. වීරසිංහ මහත්මිය (ස්වීඩනය), එම්.අයි.ඊ. වික්‍රමසිංහ මහතා (මැලේසියාව), මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක (කැනඩාව) යන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දස දෙනෙක් සිය පර්යේෂණ ඉදිරිපත් කිරීම පිණිස විදේශීය සම්මේලන/ වැඩමුළුවලට සහභාගි වූහ. ඊට අමතරව, ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක (ඉන්දියාව), ආචාර්ය එම්.ඩී.ආර්.එන්. දයාරත්න (ඉතාලිය), ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා (කොරියාව)එච්.ඊ.එම්.එච්.බී. ඒකනායක මහතා (ස්වීඩනය), ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මහත්මිය (ස්පාඤ්ඤය), මහාචාර්ය කේ.පි.හේවාගමගේ (මැලේසියාව, ස්වීඩනය (තෙවරක්), කොරියාව), ආචාර්ය කේ.එල්. ජයරත්න (සිංගප්පූරුව). එස්.එස්.පී.මාතරආරච්චි මහතා (මැලේසියාව), ආචාර්ය ඩී.එන්. රණසිංහ (ඉන්දියාව), එම්.ඩබ්.ඒ.සී.ආර්.විජේසිංහ (ප්‍රංශය) යන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 11 දෙනා විදේශ රටවල පැවති සම්මේලන/ වැඩමුළු සඳහා සහභාගි වූහ.

කාර්ය මණ්ඩල සාමාජිකයෝ 7 දෙනෙක් විදේශ සංචාර සඳහා පුද්ගලික නිවාඩු ලබා ගත්හ. ඔවුන් නම්; ආචාර්ය එම්.ඩී.ආර්.එන්. දයාරත්න (ඉන්දියාව), කේ.එස්. ගුණතිලක මහතා (නේපාලය), ඩී.එන්. ගුණවර්ධන මහතා (ඉන්දියාව දෙවරක්), ආචාර්ය කේ.එල්. ජයරත්න (ඉන්දියාව දෙවරක්, එ.රා.), ආචාර්ය ඩී.එන්. රණසිංහ (ඉන්දියාව),ආර්.එම්.පී.එන්. සෝමරත්න මහත්මිය (එ.රා.), සහ මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක (මැලේසියාව සහ ඉන්දියාව) යන අයයි.

එම්.අයි.ඊ. වික්‍රමසිංහ මහතා(මැලේසියාව) සහ එල්.එන්.සී.ද සිල්වා මහත්මිය (ශ්‍රී ලංකාව) සිය ශාස්ත්‍රීය නිබන්ධන ඉදිරිපත් කර රාජකාරි භාර ගත් අතර වී.බී.විජේසූරිය මහතා (එ.රා) සිය උසස් උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ආපසු පැමිණියේය.

එච්.එම්.සිරිවර්ධන මහතා (ජපානය) අධ්‍යයන නිවාඩු පිට සිටියි. ආර්.එම්.පී.එන්.සොමරත්න මහත්මිය එක්සත් රාජධානියේ දර්ශනපති අධ්‍යයන කටයුතු සඳහා දෙසැ.සිට අධ්‍යයන නිවාඩු ලබා සිටියි.

**කාර්යමණ්ඩල සුභසාධනය**

**රක්ෂණ යෝජනා ක්‍රමය**

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය උදෙසා 2013 වර්ෂයේදී රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. සේවා නියුක්තිකයන්ගෙන් 1/3ක් පමණක් මෙම යෝජනා ක්‍රමයට සම්බන්ධ වූ අතර එය 2014දී කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය සමග එක්ව හිමිකම් පෑ හැකි මුදලට වඩා බොහෝ අඩු වාරිකයක් ගෙවිය යුතු, ප්‍රතිලාභ සඳහා හිමිකම් කීමේ ක්‍රමයක් සමග නැවත ස්ථාපනය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය 2015 දී ක්‍රියාත්මක විය.

**වාර්ෂික විනෝද චාරිකාව**

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන කාර්ය මණ්ඩලය ඔක්. 23-27 දක්වා කණ්ඩායම් දෙකක් වශයෙන් වාර්ෂික විනෝද චාරිකාව සිංගප්පූරුව බලා පිටත් විය. සුභසාධක සංගමය විසින් කාර්ය මණ්ඩලයට සපයනු ලබන ශීතකරණ, මයික්‍රොවේව් උඳුන් පහසුකම් ඵලදායිව යොදාගන්නා ලදී. 2015 ජන.01 දින භාවිතය සඳහා ව්‍යායාම උපකරණ හඳුන්වා දෙන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මගින් උත්පාදිත දායක අරමුදල් රු. මිලියන 5ක් සුභසාධක සංගමයේ කටයුතු සඳහා යොදා ගන්නා ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන සුභසාධක සංගමය විසින් වාර්ෂික විනෝද චාරිකාව සඳහා අරමුදල් රැස් කර ගැනීමට සැප්.08 වන දින සංගීත සංදර්ශනයක් සංවිධානය කරන ලදී.

## මූල්‍ය පාලනය

**පුනරාවර්තන වියදම්**

ප්‍රථම උපාධි අපේක්ෂක ක්‍රියාකාරකම් සඳහා භාණ්ඩාගාර අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ජනිත ආදායම භාවිත කරමින් දෛනික කටයුතු සඳහා දායක විය. ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් පිරිවැය රු. 195,000ක් වූ අතර ප්‍රාග්ධන වියදම් වශයෙන් තවත් මිලියන 102ක් වැය කරන ලදී. අභ්‍යන්තර ප්‍රථම උපාධි වැඩසටහන සඳහා මිලියන130 ක දායකත්වයක් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය දැරිය.එය ප්‍රථම උපාධි පුනරාවර්ථන වියදමින් 56%කි. පුද්ගල වේතන වැඩි කිරීම හැරුණු විට රජයේ මුදල් වෙන් කිරීම් පෙර වර්ෂයට වඩා පහත දමා ඇත. පුනරාවර්තන වියදමේ පහත වැටීම 18 වගුවේ දැක්වේ.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය වෙත ප්‍රමාණවත් මුදල් වෙන් කිරීම් ලබා නොදීම හේතුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට මුදල් වෙන් කිරීම් පිළිබඳ සාකච්ඡා කිරීමට 2015 ජනවාරි 5 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී සමග රැස්වීමක් පවත්වන ලදී.

වගුව 18: පුනරාවර්තන වියදම් රු. 000'

| විෂයය | 2014 | 2015 |
|---|---|---|
| පුද්ගල වේතන | 124,691 | 148,462 |
| ගමන් වියදම් | 645 | 1,060 |
| සැපයුම් | 8,969 | 6,489 |
| නඩත්තු | 5,303 | 5,400 |
| ගිවිසුම්ගත සේවා | 37,614 | 35,810 |
| වෙනත් | 108,306 | 109,831 |
| එකතුව | **285,528** | **307,052** |
| රජයේ මුදල් වෙන් කිරීම | 93,716 | 122,300 |

ප්‍රාග්ධන වියදම්

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය, එහි පරිගණක භාවිත පහසුකම් වැඩිදියුණු කිරීමට භෞතික සම්පත්වල ආයෝජනය කරන ලදී. උත්පාදිත අරමුදල් යොදවා පරිගණක විද්‍යාගාර කිහිපයක නවීන, උසස් තාක්ෂණික මෙවලම් ස්ථාපනය කරන ලදී.මෙම අධ්‍යයනායතනයේ වත්කම් පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාමට තීරු සංකේත පද්ධතියක් පිහිටුවන ලදී. වැඩි වූ ධාරිතාවට සරිලන ලෙස පරිගණක ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ මෙවලම් වැඩිදියුණු කරන ලදී.

ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 19 වගුවේ දැක්වේ. මූල්‍ය ප්‍රගතිය හා පුනරාවර්තන සහ ව්‍යාපෘති වියදම් 20-24 වගු මගින් දැක්වේ.

වගුව 19: ප්‍රාග්ධන වියදම් රු. 000 '

| විෂයය | 2014 | 2015 |
|---|---|---|
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ අත්කර ගැනීම | 37,328 | 16,875 |
| යන්ත්‍රෝපකරණ අත් කර ගැනීම | - | - |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත් කර ගැනීම | 71,702 | 81,906 |
| වෙනත් | 6,506 | 4,268 |
| එකතුව | **115,536** | **103,049** |
| රජයේ මුදල් වෙන් කිරීම් | 15,000 | 43,082 |

**ව්‍යාපෘති (දේශීය/ විදේශීය අරමුදල්)**

අධ්‍යන ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධයෙන් ශක්තිමත් පර්යේෂණ කණ්ඩායමක් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සතුව ඇත. නිරූපකරණය සහ අනුරූපනය,(ක්ෂේත්‍ර කාලතුවක්කු ශිල්ප අනුරූපනය, විද්‍යුත් ලොග් පොත) ඉ-ඉගෙනුම (ඉංග්‍රීසි භාෂාව වැඩිදියුණු කිරීම) තිරසාර පරිගණක භාවිතය (හස්තින්ගේ හැසිරීම් නිරීක්ෂණය) ආහාර සුරක්ෂිතතාව (කෘෂිකර්මය), භාෂා තාක්ෂණය (භාෂා ව්‍යාපෘතිය)චක්‍රීය ප්‍රතිසංස්කරණය සහ ස්වයං අධීක්ෂණය යනාදිය පරිශීලන ප්‍රජාව වෙත ප්‍රවේශ වූ අවස්ථා අතර විය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය, විෂයන්තර පර්යේෂණ සහයෝගිතා සංස්කෘතියක් නිර්මාණය කර ඇති අතර කර්මාන්ත-විශ්වවිද්‍යාල සුසංයෝගයද ශක්තිමත් කර ඇත.

පර්යේෂණ පාදක කරගත් ව්‍යාපෘතිවලට අමතරව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය මගින් රාජ්‍ය සහ පුද්ගලික අංශයට උපදේශන සේවා සපයයි. අතීතයේ සිදු කළ ඇතැම් කාර්යයන් සම්බන්ධයෙන් මෙම අධ්‍යයනායතනය ජනප්‍රිය වී ඇත. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය1981 සිට ජාතික මැතිවරණවලට සහය දක්වා ඇති අතර වර්ෂය තුළ පවත්වන ලද ජනාධිපතිවරණය සහ මහමැතිවරණය යන මැතිවරණ දෙකේදීද සහය දක්වන ලදී. වර්තමානයේ දිවයින පුරා උපත්, විවාහ සහතික නිකුත් කරනුයේ මෙම අධ්‍යයනායතනය සකස් කළ මෘදුකාංගය උපයෝගී කරගනිමින්ය. නූතන පරිගණකවල සිංහල භාෂාවෙන් කටයුතු කළහැකි ව ඇත්තේ සැලසුම් කර වැඩිදියුණු කළ සිංහල යුනිකෝඩ් හරහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය දැරූ වෑයම නිසාවෙනි. වර්ෂය තුළදී වෙබ් අඩවි අටක් නිර්මාණය කරන ලදී. ඊට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විශ්‍රාම වැටුප් පද්ධතිය, ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය (ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම), වෛද්‍ය පශ්චාද් උපාධි ආයතනයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගෙවීම් පිවිසුම් පද්ධතිය,රාජ්‍ය ඖෂධ සංස්ථාවේ ටෙන්ඩර් කළමනාකරන පද්ධතිය,"කප්රුක ආයෝජන" ණය යෝජනා ක්‍රමයේ තොරතුරු කළමනාකරණ පද්ධතිය, ජාතික අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ මත්ද්‍රව්‍ය අවභාවිත කළමනාකරණ පද්ධතිය, බලපත්‍ර තොරතුරු කළමනාකරණ පද්ධතිය සහ මාර්ගගත සේවාලාභි සම්බන්ධතා එකතුව යනාදිය මෘදුකාංග සංවර්ධන ඒකකයේ සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති සමහරකි.හිමිකම් ලියාපදිංචි කිරීමේ පද්ධතිය, නිතිපති දෙපාර්තමේන්තුව සඳහා නඩු හඳුනාගැනීමේ පද්ධතිය සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ "රින් බ්‍රයිට් ස්ටාර්" වැඩසටහන නිමකළ ව්‍යාපාති කිහිපයකි.

ඉ- ඉගෙනුම් මධ්‍යස්ථානය හරහා බොහෝ ආයතන වෙනුවෙන් ඉ- පරික්ෂණ පාදක කරගත් බඳවාගැනීමේ පරික්ෂන කිහිපයක් පවත්වන ලද අතර HETC වෙනු◌ා◌ාවෙන් තොරතුරු තාක්ෂණ සහ ඉංග්‍රීසි ඉ- පරික්ෂණ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් පවත්වන ලදී. එමෙන්ම මෙම අධ්‍යයනායතනය අධිකරණ නඩු කටයුතු සඳහා සහය වෙමින් සංඛ්‍යාංක අධිකරණ වෛද්‍ය කටයුතු පවත්වාගෙන යයි.

**තීක්ෂණ**

තීක්ෂණ, 2006 දී කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් ස්ථාපනය කර කළමනාකරණ කරනු ලබන සමාගමකි. 2014/15 මූල්‍ය වර්ෂය අවසානයේ ලාභයක් ලබමින් වර්ෂය තුළ දේශීය හා අන්තර්ජාතික ප්‍රජාවගේ ආකර්ශනය

දිනාගැනීමට "තික්ෂණ"ට හැකි විය. 2014 වර්ෂය සඳහා හොඳම ඉ-රාජ්‍ය සහ දත්ත සඳහා වන ඉ- ස්වාභිමානී සම්මානයද දිනා ගත් ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන් නිර්මාණය කළ ස්වයංක්‍රීය ඇඟිලි සළකුණු හඳුනාගැනීමේ පද්ධතිය (AFIS) හේතුවෙන් මේආයතනය කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට එහි ප්‍රවේශ පද්ධතිය සඳහාද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ උප්පැන්න විවාහ සහ මරණ සහතික නිකුත් කිරීමේ පද්ධතිය සඳහාද ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ A සිට M දක්වා සහ L K යන වසම් ක්‍රමවත් කිරීමටද තීක්ෂණ සහය දැක්විය. ඊට අමතරව, තීක්ෂණ, තොරතුරු තාක්ෂණ උපාධිය, දර්ශනපති උපාධි සඳහා මාර්ගගත සහ මාර්ගඅපගත පද්ධති පවත්වාගෙන යාම මගින් සිය සහය තවදුරටත් ව්‍යාප්ත කර තිබේ. සමාගමේ උපදේශනයෙන් ලද ආදායම 48%කින් පහත වැටුණද එහි සමස්ත ධනය 11.85%කින් වර්ධනය වී ඇත.ඇතැම් ව්‍යාපෘතිවලින් ඉහළ ලාභාන්තිකයක් ඉපයීම හේතුවෙන් පසුගිය වර්ෂයේ වාර්තාගත රු. මිලියන 4.2ක් වූ ලාභයට සාපේක්ෂව රු. මිලියන 1.5ක බදු පෙර ලාභයක් සාධනය කරගන්නා ලදී. තීක්ෂණ සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීම 2015 සැප්.මස 18 දින පවත්වන ලදී. අපරාධ වාර්තා සඳහා ස්වයංක්‍රීය ඇඟිලි සළකුණු හඳුනාගැනීමේ පද්ධතිය (AFIS) 2015දී මාන්තන් සම්මානය සඳහා විද්‍යුත්-පාලනය අංශය යටතේ අවසාන වටයට තෝරා ගැනුණි.

### ප්‍රදර්ශන

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය, ඉන්ෆොටෙල් ප්‍රදර්ශනය සහ පාසල් ශිෂ්‍ය ව්‍යාපෘති කිහිපයක් ඇතුලු තවත් ප්‍රදර්ශනවලට සහභාගී විය. ඒ හැරුණු විට, වර්ෂය මුළුල්ලේම සතිපතා ගුවන්විදුලි වැඩසටහන් ප්‍රචාරය කරන ලදී.

20 වගුව: පුනරාවර්තන වියදම්

රු. 000 '

| නම සහ විස්තරය | ප්‍රදානය | අරමුදල් සපයන නියෝජිතායතනය | ඇ.මු.පි | යෙදුම් | ව.සා. |
|---|---|---|---|---|---|
| විකිරි දත්ත පාදම | 1,558 | පරිගණක විද්‍යාව පිලිබඳ ස්වීඩන ආයතනය | | | |
| ගිම්හාන පාසල් ව්‍යාපෘතිය | 2,777 | ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලය | | | |
| ASSERT | 2,087 | උප්සලා විශ්වවිද්‍යාලය | | | |
| **විදේශීය අරමුදල්** | **6,422** | | | | |
| ක්ෂේත්‍ර කාලතුවක්කු ශිල්ප අනුරූපනය | 2,428 | ආරක්ෂක අමාත්‍යාංශය | | | |
| ත්‍රිමාණ වෙරළ ආරක්ෂක පද්ධතිය | 2,655 | ජාතික විද්‍යා පදනම | | | |
| වැව්ලි නිෂ්පාදනය අධීක්ෂණය සහ කළමනාකරණය | 6,008 | ජාතික විද්‍යා පදනම | | | |
| විවිධ ප්‍රජාවන් සඳහා ඉ-ඉගෙනුම | 1,020 | ජාතික විද්‍යා පදනම | | | |
| Face ID-ත්‍රිමාණ ප්‍රස්ථාර ඇසුරින් අපරාධ විද්‍යාත්මක චක්ත්‍රිය ප්‍රතිසංස්කරණ | 1,569 | ජාතික විද්‍යා පදනම | | | |
| ගුවන් යානා පුහුණු අනුරූපන ව්‍යාපෘතිය | 1,008 | ආරක්ෂක අමාත්‍යාංශය | | | |
| අන්තරගතය පදනම් කරගත් ස්වයංක්‍රිය පාලන පද්ධතිය | 800 | උසස් අධ්‍යාපනය සඳහා වන ජාතික මධ්‍යස්ථානය | | | |
| **දේශීය අරමුදල්** | **20,226** | | | | |

ඇ.මු.පි.- ඇස්තමේන්තුගත මුළු පිරිවැය ව.සා.- වට්ටම් සාධකය

**ව්‍යාපෘති වියදම් (දේශීය/විදේශීය අරමුදල්)**

වගුව 21: ව්‍යාපෘති වියදම

| නම | TCEඉ/ග ෙට සත්‍ය පිරිවැය | 2013 වියදම | 2014 වියදම | 2014.12.31 දිනට සමුච්චිත වියදම | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| ටිකිරි දත්ත පාදම | | 120 | 465 | 585 | 99% |
| ගිම්හාන පාසල් ව්‍යාපෘතිය | | | 2345 | 2345 | 100% |
| ASSERT | | | 656 | 656 | 25% |
| විදේශීය ව්‍යාපෘති පිරිවැය | | 120 | 3,466 | 3,586 | |
| ක්ෂේත්‍ර කාලතුවක්කු ශිල්ප අනුරූපන පද්ධතිය | 1010 | 458 | 515 | 1983 | 95% |
| ත්‍රිමාණ වෙරළ ආරක්ෂක පද්ධතිය | 1709 | 607 | 273 | 2589 | 100% |
| වැව්ලි නිෂ්පාදනය අධීක්ෂණය සහ කළමනාකරණය | | 1666 | 1786 | 3452 | 50% |
| විවිධ ප්‍රජාවන් සඳහා ඉ-ඉගෙනුම | | | 309 | 309 | 100% |
| Face ID-ත්‍රිමාණ ප්‍රස්ථාර ඇසුරින් අපරාධ විද්‍යාත්මක වක්ත්‍රිය ප්‍රතිසංස්කරණ | | | 426 | 426 | 50% |
| ගුවන් යානා පුහුණු අනුරූපන ව්‍යාපෘතිය | | | 836 | 836 | 90% |
| අන්තර්ගතය පදනම් කරගත් ස්වයංක්‍රිය පාලන පද්ධතිය | | | 335 | 335 | 100% |
| **දේශීය ව්‍යාපෘති වියදම** | 2,719 | 4,515 | 6,220 | 13,454 | |

**මූල්‍ය ප්‍රගතිය (වියදම්)**

වගුව 22: මූල්‍ය ප්‍රගතිය ( වියදම්) රු 000'

| විෂයය | ප්‍රතිපාදන | වියදම | ඉතුරුම්/අතිරික්තය |
|---|---|---|---|
| පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 269,025 | 285,528 | (16,503) |
| ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර) | 199,450 | 132,206 | 67,244 |
| ව්‍යාපෘති-දේශීය අරමුදල් | 13,454 | 13,454 | 0 |
| ව්‍යාපෘති- විදේශීය අරමුදල් | 8,920 | 8,920 | 0 |
| එකතුව | 4,908,490 | 440,108 | 50,741 |

**මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම)**

23 වගුව: මූල්‍ය ප්‍රගතිය (උත්පාදිත ආදායම) රු.000 '

| ආදායම් මූලාශ්‍රය | ප්‍රතිපාදන | එකතු කිරීම් | හිඟය/අතිරික්තය |
|---|---|---|---|
| ප්‍රථම උපාධි අපේක්ෂක අධ්‍යයන | 2,775 | 4,366 | 1,591 |
| පශ්චාද් උපාධි අධ්‍යයන | 63,103 | 66,469 | (3,366) |
| උපදේශක මණ්ඩල | 11,500 | 18,589 | 7,089 |
| බාහිර උපාධි | 88,915 | 72,620 | (16,295) |
| වෙනත් | 53,254 | 75,426 | 22,172 |
| එකතුව | 272,801 | 237,470 | 11,191 |

ප්‍රථම උපාධි ආදායම හැර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය රු. 237,470,000ක් උපයා ගත්තේය. එය බොහෝ විශ්වවිද්‍යාල සහ අසස් අධ්‍යාපන ආයතනවල ආදායමට වඩා බොහෝ ඉහළ ආදායමකි.

**මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය**

24 වගුව: මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

| විෂයය | සූත්‍රය | එක් ශිෂ්‍යයකු සඳහා වියදම |
|---|---|---|
| එක් ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම (පුන. වි) | පුන. වි/ශිෂ්‍ය සංඛ්‍යාව | 195 |
| එක් ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම (ප්‍රා. වි) | ප්‍රා.වි/ ශිෂ්‍ය සංඛ්‍යාව | 134 |
| එකතුව | | 329 |

**2015දී ලද යටිතල පහසුකම්**

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ශ්‍රවණාගාරය සහ දේශනශාලා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මිලියන 75ක් වෙන් කරන බවට පොරොන්දු වෙමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කළත්,උත්පාදිත ආදායම යොදවා ඉදිකිරීම් වැඩ සිදු කරන ලද අතර වර්ෂය අවසානයේ ඉතිරි වූ යම් අරමුදල් ප්‍රමාණයක් ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමත් විය වර්ෂය අවසාන වන විට සිව්මහල් ගොඩනැග්ල්ලේ සැකිල්ල සම්පූර්ණ කළ අතර 2016දී එම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. පරිපාලන ගොඩනැගිලි ඉදිකිරීමේ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට 2014 මැද භාගයේදී අමාත්‍යාංශයට යොමු කළද, ඒ සඳහා අනුමැතිය නොලැබුණි. ගොඩනැගිලි කටයුතු පිළිබඳ විස්තර 25 වගුවේ දැක්වේ.

25 වගුව: යටිතල ව්‍යුහය රු.000'

| යටිතල ව්‍යුහය පිළිබඳ විස්තර | වියදම(රු) | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| ආපන ශාලාව සහ පරිපාලන ගොඩනැගිල්ල- 1 අදියර | 49,318 | 100% |
| කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ශ්‍රවණාගාරය සහ දේශනශාලා | 108,408 | 30% |

**වෙනත් විස්තර/ මෙම වාර්තාවට අදාළ කාර්යසාධනය**

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ක්‍රියාකාරකම් කෙරෙහි දේශීයව හා අන්තර්ජාතිකව අවධානය යොමු කරවා ගැනීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන වෙබ් අඩවිය සහ සමාජ ජාල හරහා ප්‍රචාරය සිදු කරන ලදී.තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ නිෂ්පාදන අවට පැතිරවීම ඔවුන්ගේ එක් සමාජ වගකීමක් බව මෙම ආයතනය සළකයි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් සෑම බදාදා දිනකම උදෑසන 9 සිට 10 දක්වා විකාශනය කරන රූපවාහිනී වැඩසටහන ඔස්සේ ප්‍රජා සම්බන්ධතා අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය තොරතුරු විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික ඔලිම්පියාඩ් (IOI) ඇතුළු මෘදුකාංග තරඟ පවත්වමින් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පාසල්වලටද සහය දැක්විය. ජූලි 26 සිට අගෝ. 02 දක්වා කසකස්ථානයේ අල්මාටි හි පැවැත්වීමට නියමිත IOI '15 තරඟයට සහභාගි වීම සඳහා තෝරාගන්නා ලද නායක, උපනායකවරුන්ගෙන් සමන්විත සිව් සාමාජික කණ්ඩායමට NSF සමග එක්ව සහයෝගය දක්වන ලදී. මෙම කණ්ඩායම මැයි 09 දින පැවති තොරතුරු විද්‍යාව පිළිබඳ ඔලිම්පියාඩ් ආසියා පැසිෆික් තරඟයට (APIO) ඉදිරිපත් විය.

ආදි ශිෂ්‍ය සංගමය නැවත සක්‍රිය කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ආදිශිෂ්‍යයන් සමග රැස්වීමක් පවත්වන ලද අතර ඔක්තෝබර් 08 වන දින වාර්ෂික මහ සභා රැස්වීම පවත්වන ලදී.

# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## කොළඹ විශ්වවිද්‍යාලය

## 2015 දෙසැම්බර් 31 දිනට විස්තරාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| වත්කම් | සටහන් | 2015 රු. | 2014 රු |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල පිරියත හා උපකරණ | | 214,728,408 | 230,982,413 |
| දීර්ඝ කාලීන ආයෝජන | | 5,000,000 | 5,000,000 |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | | 33,533,975 | 34,451,935 |
| නොනිමි ඉදිකිරීම් | | 108,407,695 | 26,500,920 |
| ජංගම වත්කම් | | | |
| තොග | | 2,800,202 | 2,755,377 |
| ජංගම ගිණුම | | – | – |
| ලැබිය යුතු සහ පෙරගෙවුම් | | 55,962,035 | 68,937,373 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | | 642,565,557 | 649,119,872 |
| මුළු ජංගම වත්කම් | | 701,327,794 | 720,812,622 |
| මුළු වත්කම් | | 1,062,997,874 | 1,017,747,900 |

### කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## 2015 දෙසැම්බර් 31 දිනට විස්තරාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ඉතිරි කොටස)

| | සටහන් | 2015 රු. | 2014 රු |
|---|---|---|---|
| <u>හිමිකම් හා බැරකම්</u> | | | |
| <u>ප්‍රාග්ධනය හා සංචිත</u> | | | |
| <u>ප්‍රාග්ධනය</u> | | | |
| වැය නොකළ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | | 7,155,617 | 11,708,963 |
| වැය කළ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | | 326,335,778 | 235,503,117 |
| වැය නොකළ මුළු ව්‍යාපෘති ප්‍රදාන | | 3,083,213 | 9,096,416 |
| වැය කළ මුළු ව්‍යාපෘති ප්‍රදාන | | 6,567,467 | 12,517,918 |
| කොළඹ විශ්වවිද්‍යාලයීය දායකත්වය | | 8,155,714 | 8,155,714 |
| එකතුව | | 351,297,789 | 276,982,128 |
| සංචිත | | 368,478,077 | 403,940,980 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 3,000,000 | 3,000,000 |
| සීමිත අරමුදල් | | 168,062,383 | 128,472,862 |
| <u>ජංගම නොවන බැරකම්</u> | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ | | 33,625,108 | 34,251,258 |
| <u>ජංගම වගකීම්</u> | | | |
| වෙනත් උපචිත හා ගෙවිය යුතු වියදම් | | | |
| ජංගම ගිණුම | | 138,534,517 | 171,100,672 |
| එකතුව | | 138,534,517 | 171,100,672 |
| මුළු හිමිකම් හා බැරකම් | | 1,062,997,874 | 1,017,747,900 |

..........................

නියෝජ්‍ය මූල්‍යාධිකාරී

පිටු අංක 1 සිට 5 දක්වා සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 97 පිටුවේ සිට 104 පිටුව දක්වා ඇතුළත් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත් කොටස් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනඅධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලදී.

..........................

අධ්‍යක්ෂ

2016.06.29

..........................

නියෝජ්‍ය අධ්‍යක්ෂ

## කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## කොළඹ විශ්වවිද්‍යාලය

### 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා විස්තරාත්මක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| | 2015 රු. | 2014 රු |
|---|---|---|
| ප්‍රථම උපාධි පාඨමාලාව | | |
| ආදායම | | |
| රජයේ ප්‍රදාන | 122,300,000 | 93,716,000 |
| රඳවාගත් ආදායම්- ප්‍රදාන | 17,264,973 | 15,261,355 |
| වෙනත් | 5,015,342 | 4,367,219 |
| | 144,580,315 | 113,344,574 |
| වියදම | | |
| පුද්ගල වේතන | 116,837,727 | 89,779,332 |
| ගමන් වියදම් | 392,231 | 161,441 |
| සැපයුම් | 5,724,199 | 8,057,216 |
| ගිවිසුම්ගත සේවා | 34,312,251 | 37,313,552 |
| විශ්‍රාම ප්‍රතිලාභ | 15,627,462 | 15,525,053 |
| ගාස්තු,දායකත්ව මුදල් සහ සාමාජික ගාස්තු | 224,673 | 108,890 |
| කාර්යමණ්ඩල සංවර්ධනය | 413,500 | 211,000 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 10,798,354 | 10,577,455 |
| ක්ෂය | 30,017,067 | 21,418,266 |
| එකතුව | 214,347,465 | 182,879,205 |
| ප්‍රථම උපාධි පාඨමාලාවෙන් ජනිත හිඟය | (69,767,151) | (69,534,629) |
| විස්තාරිත පාඨමාලාව | | |
| දර්ශනපති පාඨමාලාව-(MSc) | 45,703,965 | 47,256,202 |
| බාහිර උපාධි මධ්‍යස්ථානය (BIT) | 10,837,541 | 37,012,897 |
| පරිගණන සේවා මධ්‍යස්ථානය (CSC) | 799,107 | 2,255,363 |
| ඉ- ඉගෙනුම් මධ්‍යස්ථානය (eLC) | 12,458,408 | 11,285,752 |
| වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC) | 12,458,408 | 11,285,752 |
| ඩිජිටල් බහුමාධ්‍ය පිළිබඳ උසස් මධ්‍යස්ථානය (ADMTC) | (658,271) | (289,738) |
| විස්තාරිත වැඩසටහන්වලින් ජනිත | (106,754) | 788,354 |
| අතිරික්තය | 69,033,996 | 98,308,830 |
| ව්‍යාපෘති | | |
| විදේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති | 6,365,898 | 35,302 |
| ICTer Conference-2015 | 1,994,948 | 1,110,876 |
| IDRC අරමුදල් ගම්මාන | _ | 199,944 |
| ව්‍යාපෘතිවලින් ජනිත අතිරික්තය | 8,360,846 | 1,346,122 |
| තීක්ෂණ | 4,318 | 867,901 |
| ශුද්ධ අතිරික්තය/(හිඟය) | 7,632,010 | 30,988,224 |

## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා විස්තරාත්මක මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය | සටහන් | | 2015 | 2014 |
|---|---|---|---|---|
| | | රු. | රු | රු. |
| වර්ෂය සඳහා හිඟය/ අතිරික්තය | | 7,632,010 | 7,632,010 | 30,988,224 |
| <u>ගැලපීම්</u> | | | | |
| ක්ෂය | | 41,535,502 | | 32,924,670 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 2,223,410 | | 3,686,567 |
| රඳවාගත් ආදායම් | | (21,388,101) | | (19,585,628) |
| පෙර ලැබුණු ප්‍රදාන මාරුකිරීම | | (9,657,353) | | (10,048,003) |
| PPP මගින් ලැබුණු ලාභය | | (17,550) | | (190,806) |
| හුවමාරු ඉපයුම් | | (6,321,986) | 6,373,922 | (408,592) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ඌණතාවය | | | 14,005,932 | 37,366,432 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | | | (19,635,637) | (11,886,227) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් | | | (5,629,705) | 25,480,205 |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ</u> | | | | |
| දේපල පිරියත හා උපකරණ අත්කරගැනීම් | | (22,425,594) | | (35,722,193) |
| යටිතල පහසුකම් සංවර්ධනය | | (63,131,487) | | (89,612,748) |
| දේපල පිරියත හා උපකරණ විකිණීම | | 0 | | 196,600 |
| දේපල පිරියත හා උපකරණ ප්‍රතිසංස්කරණය සහ නඩත්තු කිරීම | | (1,917,943) | (87,475,024) | (6,133,904) |
| | | | (93,104,729) | (105,792,040) |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ</u> | | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්- රජයේ | | 45,000,000 | | 15,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්- උත්පාදිත අරමුදල් (ශුද්ධ) | | 58,477,820 | | 41,343,330 |
| යටිතල පහසුකම් අරමුදලෙන් මාරුකිරීම | | (87,467,258) | | |
| PPP විකිණීම | | 17,550 | | |
| ව්‍යාපෘති ප්‍රදාන ලැබීම් | | 15,348,964 | | 16,271,736 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | 929,269 | | 2,000 |
| ව්‍යාපෘති ශේෂයන් මාරු කිරීම | | _ | | 1,068,757 |
| ගෙවූ පාරිතෝෂික | | (2,797,809) | | (1,150,778) |
| සීමා කළ අරමුදල්වලින් ලැබීම් | | 50,719,890 | 80,228,426 | 35,380,673 |
| | | | (12,876,303) | 2,123,678 |
| මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම/අඩුවීම | | | | |
| හුවමාරු ලාභය/(පාඩුව) | | | 6,321,986 | 408,592 |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 649,119,874 | 646,587,603 |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | | 642,565,557 | 649,119,874 |

# කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය

## වැදගත් මූල්‍ය තොරතුරු

| මූල්‍ය වර්ෂය | රු. '000 | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 122,300 | 93,716 | 90,383 | 91,802 | 83,102 |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 43,082 | 15,000 | 25,759 | 19,150 | 16,000 |
| මුළු රජයේ ප්‍රදාන ලැබීම් | 165,382 | 108,716 | 116,142 | 110,952 | 99,102 |
| පුනරාවර්තන වියදම්- ප්‍ර.උ.පාඨමාලාව | 184,330 | 160,901 | 133,190 | 111,212 | 92,310 |
| ප්‍රාග්ධන වියදම් | 104,927 | 132,206 | 71,371 | 31,178 | 28,628 |
| මුළු වියදම්- ප්‍ර.උ. පාඨමාලාව | 289,257 | 293,107 | 204,561 | 142,390 | 120,938 |
| උත්පාදිත ආදායමෙන් දායක වීම | 61,845 | 184,391 | 88,419 | 31,438 | 21,836 |
| උත්පාදිත දළ ආදායමෙන් දායක% | 30% | 78% | 37% | 16% | 14% |
| උත්පාදිත ශුද්ධ ආදායමෙන් දායක % | 88% | 163% | 63% | 28% | 28% |
| උත්පාදිත ආදායම | 211,430 | 247,470 | 242,025 | 194,230 | 159,429 |
| පුනරාවර්තන වියදම්- විස්තාරිත පාඨමාලා | 133,083 | 124,627 | 102,173 | 82,390 | 80,197 |
| විදේශය අරමුදල් යෙදවූ ව්‍යාපෘති සඳහා ලැබුණු ප්‍රදාන | 14,176 | 9,713 | 9,341 | 5,639 | 6,202 |
| අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව | 770 | 850 | 879 | 737 | 737 |
| සේවක සංඛ්‍යාව | 207 | 179 | 144 | 144 | 144 |
| එක් ශිෂ්‍යයෙකු සඳහා වාර්ෂික පුනරාවර්තන පිරිවැය ('000) | 195 | 190 | 152 | 151 | 125 |
| එක් ශිෂ්‍යයෙකු සඳහා වාර්ෂික ප්‍රාග්ධන පිරිවැය ('000) | 134 | 156 | 81 | 42 | 39 |
| එක් සේවකයෙකු සඳහා වාර්ෂික පිරිවැය ('000) | 881 | 795 | 774 | 670 | 578 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/යුසීඑස්සී /6/15/03

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2016 දෙසැම්බර් 09 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් :-

1. ලේකම් , උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් , මුදල් අමාත්‍යාංශය
3. සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/යූසීඑස්සී /6/15/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 දෙසැම්බර් 09 දින

අධ්‍යක්ෂ,
කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම් මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.207,525,093 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම්වල වටිනාකම හා ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වටිනාකම අතර රු.75,821,489 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 4 කට පෙර විභාග දෙපාර්තමේන්තුවට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට හා ජාතික විද්‍යා පදනමට සේවා සැපයීම වෙනුවෙන් රු. 1,747,525 ක මුදලක් ලැබිය යුතුව ඇතත් මෙම ශේෂයන් අයකර ගැනීමට ආයතනය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ආපදා ණය ලබා දීමේදී විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ඇපයක් ලෙස භාවිතා කර ඇති පුද්ගලයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු 217,584 ක ණය ශේෂයන් සඳහා වසර 16 ත් 22 ත් අතර කාලයක් ගතවී ඇතත් එම මුදල් අයකරගෙන නොතිබුණි.

(ඇ) ගිවිසුම් බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතු වසර 5ත් - 12ත් අතර කාලයක සිට පැවත එන රු. 6,057,990ක ශේෂය අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල පනත හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන හා ගිවිසුම් ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 371 | මාණ්ඩලික නොවන නිලධාරීන් 50 දෙනෙකු වෙත එකතුව රු. 8,738,543 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් ලබාදිය හැකි උපරිම සීමාව වූ රු.100,000 ඉක්මවා ආයතනය විසින් අවස්ථා 31ක දී රු.104,150 සිට රු.325,750 දක්වා පරාසයක් තුළ අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඇ) 2004 ජුලි 29 දිනැති අංක පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව රු. 561,816,857 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ සංග්‍රහය XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන නිලධාරීන් 39 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සටහන් කර ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.61,951,795ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 1978 දෙසැම්බර් 19 අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 1979 නොවැම්බර් 13 දින අංක 49 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ව්‍යාපෘති අවසන් ගිණුම් තුළ ඇතුළත් රු. 5,269,536 ක් වටිනා ජංගම නොවන වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය තුළ සමාගමක් ආරම්භ කිරීමට පෙර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාවරයාගේ නිර්දේශ සහිතව කැබිනට් අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව සමාගම් පනත යටතේ 2006 වර්ෂයේ දී තීක්ෂණ සමාගම නමින් ඇපයෙන් සීමිත සමාගමක් ලියාපදිංචි කර තිබුණි.

(ආ) විධිමත් අනුමැතියකින් තොරව ආයතනය පවත්වනු ලබන බාහිර පාඨමාලාවන්හි ආදායමින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂයේදී රු. 2,102,100 ක ගෞරවාන්විත දීමනාවක් ලබා දී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල පනත අනුව ආයතනයේ සියළුම ආදායම් ආයතනය නමින් වූ අරමුදලකට බැර විය යුතු වුවත් ඊට අනුකූල නොවන සේ විධිමත් අනුමැතියකින් තොරව ආයතනය විසින් විවිධ නම් වලින් අරමුදල් 6ක් පවත්වාගෙන ගොස් තිබූ අතර ආයතනයෙහි ආදායමින් රු. 39,349,567 ක් හා විදේශීය ව්‍යාපෘති සඳහා ලැබුණු මුදලින් රු. 40,332,985 ක් ඉහත අරමුදල් වලට බැරකර තිබුණි.

(ඈ) පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 3 වගන්තිය ප්‍රකාරව ආයතනය අලුතින් ආරම්භ කිරීමට නියමිත පාඨමාලා වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනය පවත්වනු ලබන විද්‍යාපති, දර්ශණවේදී හා දර්ශණපති පාඨමාලා 5ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතියකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 7,632,010 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 30,988,224 ක් වූ හෙයින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 23,356,214 කින් පිරිහී තිබුණි. රාජ්‍ය ප්‍රදාන රු. 28,584,000 කින් වැඩි වුවද සේවක පරිපාලන වියදම් රු.27,058,395 කින් වැඩිවීම හා පාඨමාලා ආදායම රු. 29,274,834 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ඉකුත් වර්ෂ 04 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අතිරික්තය අඩු වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වය සියයට 8 කින් වැඩි වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුගත වී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 9/2010 හි සඳහන් අනුපාත පදනම් කර ගනිමින් දුර ප්‍රමාණය මත ආරාධිත දේශකවරුන් වෙත ප්‍රවාහන දීමනාවක් ගෙවිය හැකි වුවත් ඊට අනුකූල නොවන පරිදි පැමිණි එක් දිනකට රු. 1000 බැගින් වූ ස්ථිර අගයක් මත දේශකවරුන් 38 දෙනෙකු වෙත රු. 517,000 ක ප්‍රවාහන දීමනා ලබාදී තිබුණි.

(ආ) ආයතනය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය තුළ පාඨමාලාවලින් උපයාගත් ආදායමින් රු.2,159,349 ක් හා ව්‍යාපෘති වල අතිරික්ත මුදලින් රු.1,014,208 ක මුදලක් ඉහත අරමුදල වෙත මාරු කර තිබුණි. මෙම අරමුදලෙන් රු.3,137,921 ක වෛද්‍ය බිල්පත් වර්ෂය තුළ ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඇ) ආයතනයෙහි කාර්ය මණ්ඩලය විසින් අරමුදල් යොදවා පවත්වා ගෙන යනු ලබන සුභසාධක අරමුදලක් වෙත පාඨමාලා තුළින් උපයාගන්නා ලද ආදායමින් රු.3,204,717 ක් හා ව්‍යාපෘති සඳහා ලැබෙන විදේශීය අරමුදල් වලින් රු.1,014,208 ක් මාරු කර තිබූ අතර ඉහත අරමුදල් හුවමාරුව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති මහාචාර්ය වී.කේ සමරනායක අරමුදලේ ශේෂය රු. 14,306,550ක් වන අතර 2012 වර්ෂයේ සිට මෙම අරමුදල අරමුණු ගත කාර්යයන් සඳහා යොදවා නොතිබුණි.

(ආ) නිසිලෙස වියදම් පුරෝකථනය කළ වැය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් අවස්ථා 22 කදී අවශ්‍යව තිබුණු එකතුව රු.160,112 ක වියදම් සඳහා රු.427,250 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තීක්ෂණ සමාගම වෙනම නීතිමය ඒකකයක් ලෙස ස්ථාපිතව තිබුණද එහි පරිපාලන කටයුතු පරිගණක අධ්‍යයන ආයතනය තුළ පවත්වා ගෙන යාමත්, ආයතනයේ කාර්ය මණ්ඩලය හා සමාගමේ කාර්ය මණ්ඩලය එකම අංශයක කටයුතු කිරීමත්, භෞතික සම්පත් පොදුවේ භාවිතා කිරීමත් හේතුවෙන් පරිගණක පද්ධති නිර්මාණය හා පරිගණක උපදේශන සඳහා ලැබී ඇති ඇණවුම් හා ආදායම් නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

(ආ) ආයතනයෙහි කොන්ත්‍රාත් පදනම මත සේවය කල මෘදුකාංග ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ සේවය 2015 ජනවාරි 31 දින අවසන් කර එම ඉංජිනේරුවරුන් දෙදෙනා තීක්ෂණ සමාගම වෙත 2015 පෙබරවාරි 01 දින සිට බඳවාගෙන තිබුණි.

(ඇ) තීක්ෂණ සමාගමෙහි ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත පරිගණක අධ්‍යයන ආයතනය සපයන සේවාවන්ට සමාන වන බැවින් තීක්ෂණ සමාගම පරිගණක අධ්‍යයන ආයතනයෙහි තරඟකාරී ව්‍යාපාරයක් බව නිරීක්ෂණය විය.

(ඇ) තීක්ෂණ සමාගමේ ගිණුම්කරණ කටයුතු පරිගණක අධ්‍යයන ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරි විසින් අධීක්ෂණය කර තිබූ අතර ඒ සඳහා ගිණුම් වර්ෂය තුළ රු. 251,000 ක මුදලක් මුල්‍යාධිකාරවරයා වෙත ගෙවීම් කර තිබුණි.

(ඉ) 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව රජයට සහ රජයේ අනුබද්ධ ආයතන වෙත සියයට 51 වඩා වැඩි අයිතිය ඇති රාජ්‍ය සමාගම් විගණනය විගණකාධිපතිවරයා වෙත පැවරිය යුතු වුවත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් පරිගණක අධ්‍යයන ආයතනයට සියයට 100 ක අයිතිය සහිත තීක්ෂණ සමාගමේ බාහිර විගණනය විගණකාධිපතිගේ අනුමැතියෙන් තොරව පෞද්ගලික විගණන සමාගමක් වෙත ලබාදී තිබුණි.

(ඊ) තීක්ෂණ සමාගම තම සේවාදායකයන්ගෙන් ලැබෙන ඇණවුම් වල වටිනාකමින් සියයට 80 කට වැඩි මුදලක් එහි ප්‍රධාන විධායක නිලධාරියා ඇතුළු කාර්ය මණ්ඩලය වෙත දීමනා ලෙස ලබා දීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබීම හේතුවෙන් අනෙකුත් ආනුෂංගික වියදම් සමඟ මුළු වියදම බොහෝ විට ආදායම ඉක්මවා යා හැකි බැවින් හා 2015 වර්ෂය තුළ රු. 5,005,000 ක සේවා ආදායමක් ලැබුණද වසරේ මූල්‍ය ප්‍රතිඵලය රු. 4,318 ක් වූ අතිරික්තය ඉතා පහළ අගයක් ගෙන තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

------------------------------

ව්‍යාපෘති සඳහා විදේශීයව ලැබෙන අරමුදල් පවත්වාගෙන යන ජංගම ගිණුමෙහි, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.මිලියන 65 ක ශේෂයක් පවතින අතර 2013 හා 2014 වර්ෂවල එම ගිණුමේ ශේෂය පිළිවෙලින් රු. මිලියන 44 ක් හා රු. මිලියන 51ක් විය. මේ අනුව අදාල මුදල් අරමුණු ගත කාර්යයන් සඳහා නිසි පරිදි යොදා නොගන්නා බව නිරීක්ෂණය වූ අතර අතිරික්ත මුදල් කෙටිකාලීන ආයෝජනයන්හි යෙදවීම තුළින් ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පුරප්පාඩු 92 ක් සඳහා සේවකයන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර අනුමත කාර්ය මණ්ඩලයෙන් පරිබාහිරව කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 66 දෙනෙකු වෙත සේවාදිගු ලබා දෙමින් තවදුරටත් සේවයේ යොදවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

ආයතනයෙහි මව් ආයතනය වන කොළඹ විශ්වවිද්‍යාලය තුළ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරු දෙදෙනෙකුගෙන් සමන්විත ශක්තිමත් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිතව තිබියදී හා කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත සියළුම ආයතනයන්හි අභ්‍යන්තර විගණනය එම විගණන අංශය විසින් සිදු කරන පසුබිමක් තුළ පරිගණක අධ්‍යයන ආයතනයෙහි පමණක් අභ්‍යන්තර විගණනය පෞද්ගලික විගණන ආයතනයක් වෙත ලබා දී වාර්ෂික විගණන ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 350,000 ක මුදලක් ගෙවා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම් නිසිලෙස ලේඛන ගත නොකිරීම, නැවත අගය නොකිරීම, ඉන්වෙන්ට්‍රි ලේඛන නඩත්තු නොකිරීම. |
| (ආ) | අත්තිකාරම් පාලනය | මාණ්ඩලික නොවන නිලධාරින්ට අත්තිකාරම් ලබාදීම, සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීම, අවශ්‍යතාවය හඳුනානොගෙන අත්තිකාරම් ලබාදීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩල අවශ්‍යතා අනුව අනුමත කාර්ය මණ්ඩල සංශෝධනයට සහ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම. |
| (ඈ) | නව පාඨමාලා ආරම්භ කිරීම | අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

University of Colombo School of Computing
*The force behind ICT Education in Sri Lanka.*
35, Reid Avenue, Colombo 07, Sri Lanka.
UCSC

2017-01-06

විගණකාධිපතිතුමා
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දුව පාර
බත්තරමුල්ල

මහත්මයාණෙනි.

**කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යන ආයතන නියමාවලියේ 23 වගන්තිය හා 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

*ඉහත වාර්තාව සඳහා පිළිතුරු කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2016-12-30 වන දින පැවති විගණන කමිටුවේ නිර්දේශයෙන් සහ 2017 ජනවාරි මස 05 වන දින පැවති කළමණාකරන මණ්ඩල අනුමැතියෙන් ඉදිරිපත් කරමි.*

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිත

ආයතනය මගින් එහි ස්ථාවර වත්කම් ලේඛනය පරිගණකගත කර යලි පිළියෙල කිරිම ආරම්බ කර ඇති අතර ඒ යටතේ සම්පූර්ණ ක්ෂය වූ සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණිත අගයන් ගිනුම්වලට ගැනිමට කටයුතු කරමි.

2.2.2 ගිනුම් ප්‍රකාශනය තුල ඇතුලත් ස්ථාවර වත්කම් වල වටිනාකම සහ ස්ථාවර වත්කම් ලේඛනයේ අදාල වත්කම්වල එකතුව අතර වෙනස රු 75,821,489.00 ක් නොව 62,681,382.00 කි. මෙම වෙනස ස්ථාවර වත්කම් ලේඛනය වැඩියෙන් දැක්වනුයේ ඒ ඒ අවස්ථාවල වත්කම් ඉවත් කිරිම් ගිනුම් වාර්තා වලින් ඉවත් කර තිබුණද ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නැති නිසාය. මෙම වෙනස ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කළ පසු ඉවත්වනු ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිනුම්

(අ) මෙම ආයතනවලින් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා වරින්වර සිහිකැඳවීම් මෙන්ම වාචික විමසීම් ද කර පසුවිපරම් කටයුතු සිදු කෙරුණි. මේ සඳහා ප්‍රමුඛත්වය ලබාදී අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කරමි.



Tel: +94-11-2581245 Fax: +94-11-2587239 e-mail: info@ucsc.cmb.ac.lk Web: http://www.ucsc.cmb.ac.lk
Over 25 years of innovation in the ICT Education landscape of Sri Lanka

(ආ) අයවිය යුතු ආපදා ණය මුදල වන රු 217,584.00 ක මුදල ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් අයකරදෙන ලෙසට වන ඉල්ලීම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව වෙත විගණකාධිපතිතුමාට පිටපත් සහිතව යොමුකර ඇත.

(ඇ) එස්. ජේ. පභීරදන් මහතා (රු. 3,440,575.75) රුක්මන් සේනානායක මහතා (රු. 798,588.54) සහ ආචාර්ය උපාලි වික්‍රමසිංහ මයා (රු. 2,819,179.79). නීතිපති දෙපාර්තමේන්තුව එස්. ජේ. පභීරදන් මහතාට එරෙහිව අංක DMR/07902/10 යටතේ කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත. රුක්මන් සේනානායක මහතාට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගන්නා ලෙස නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා තිබුණි. මෙම දෙදෙනාම ශ්‍රී ලංකාව හැරගොස් විදේශ ගතව ඇති බවට පොලීසිය කරන ලද මූලික පරීක්ෂණවලින් හෙලිවී තිබුණි. නමුත් ඔවුන්ගේ විදේශ පදිංචි ලිපිනයන් සොයා ගැනීමට නොහැකිවීමෙන් ඔවුන්ට එරෙහිව නීති පියවර ඉදිරියට ගෙනයාම නීතිපති දෙපාර්තමේන්තුවට නොහැකි වී ඇත. කෙසේ නමුත් ඔවුන් දෙදෙනාගේ අර්ථ සාධක අරමුදල් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයට අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුම් දී ඇත. ආචාර්ය උපාලි වික්‍රමසිංහ මහතාගෙන් පොළිය සමග අයවිය යුතුවිය යුතු මුදල වන රු. 2,819,179.79 වාරික 12 කින් ගෙවීමට කළමණාකරණ මණ්ඩලයේ අවසරය ලබාදී ඇත. ඒ අනුව ඔහු 2016-12-15 දිනට රු. 1,480,195.94 ගෙවා ඇති අතර මීට සමගාමීව ඔහුගේ අර්ථ සාධක අරමුදල අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරන තීරණවලට අනුකූල නොවීම.

(අ) ආයතනය තුල ඉතා සීමිත මාණ්ඩලික නිලධාරින් ප්‍රමාණයක් සිටීම නිසාත් ආයතනයේ අත්තිකාරම් භාවිතයෙන් සිදුවන වැඩසටහන් සියල්ල සඳහා අරමුදල් ලබාගැනිමට මාණ්ඩලික නිලධාරින්ට පමණක් කල නොහැකි නිසාත් ස්ථිර කාර්යය මණ්ඩලවල මාණ්ඩලික නොවන කාර්යය මණ්ඩල සඳහා අත්තිකාරම් මාණ්ඩලික නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ නිකුත් කර ඇත.

(ආ) ආයතනය මගින් පවත්වන භාහිර උපාධි පාඨමාලාවේ ස්වභාවය අනුව එහි විභාග පැවැත්වීමට සහ සිසුන් ලියාපදිංචි කිරීම වැනි කටයුතු කාර්යාලයෙන් බැහැර දිවයින පුරා ආවරණය වන පරිදි යාපනය, ගාල්ල, මහනුවර වැනි ස්ථාන වල සිදුකිරීමට අවශ්‍ය නිසාත් එකී කටයුතු සඳහා ඒ ඒ අවස්ථාවල වියදම් දැරිමට සිදුවන නිසාත් ආයතනය ඉපයූ ආදායමින් අධ්‍යක්ෂකතුමාගේ අනුමැතියෙන් එකී අත්තිකාරම් නිකුත් කර ඇත.

(ඇ) 2015 වසර තුල හෝ 2014 වසර තුල කිසිදු අමතර ආයෝජනයක් සිදුකර නොමැත.2015 වරෂය තුලදී සමුච්චිත ආයෝජන ප්‍රමානය රු මිලියන 23ක් අඩු වි ඇත 2014 වර්ෂයට පෙර ඒ ඒ වර්ෂවල සිදුකරන ආයෝජනයන් සඳහා කළමනාකරන මණ්ඩලවල අනුමැතිය සහිතව භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලුම් කර ඇත.

(ඇ) ආයතනයේ සියලුම ස්ථිර අනධ්‍යයන කාර්යය මණ්ඩලය පැමිණීමේ හා පිටවීමේ කාලය අදාල යන්ත්‍රයේ ඇඟිලි සළකුණු යොදා සටහන් කරනු ලබයි. මීට අමරතව කොන්ත්‍රාත් පදනම හා දෛනික පදනම මත සේවය යොදවා සිටින සේවකයන්ද පැමිණීමේ හා පිටවීමේ කාලය සටහන් කරනු ලබයි. එහෙත් අධ්‍යයන කාර්යය මණ්ඩලය සහ අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය තම පැමිණීමේ හා පිටවීමේ වේලාව සටහන් කිරීමේ යන්ත්‍රයේ සටහන් කරනු නොලබයි.

(ඉ) විමසුමේහි සඳහන් ව්‍යාපෘති වත්කම්ද ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇත.

අදාල වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරිමට කටයුතු කරමි.

2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

(අ) මේ සම්බන්ධයෙන් විධිමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර මේ වන විට කොළඹ විශ්වවිද්‍යාලීය පාලක සභාවේ අනුමැතිය තීක්ෂණ සමාගම පිහිටු විමට ලැබී ඇති අතර අමාත්‍ය මණ්ඩලවල අනුමැතිය සඳහා වන ඉල්ලීම උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙත යොමු කර ඇත.

(ආ) සැබවින්ම මෙම ගෙවීම ගෞරවාන්විත ගෙවීමක් නොවන අතර ආයතනයේ පරිපාලන කටයුතුවල නිරත අධ්‍යයන සහ පරිපාලන නිලධාරින් සිය රාජකාරිවලට අමතරව බාහිර උපාධි පාඨමාලාව සහ පශ්චාත් උපාධි පාඨමාලාවල කරනු ලබන අමතර කාර්යයන් සහ දරන ලද වගකීම් සහ අමතර කටයුතු වෙනුවෙන් කරනු ලබන ගෙවීමකි.

මෙම ගෙවීම සඳහා අරමුදල එක් පාඨමාලවන්ගේ අනුමත අයවැය ඇස්තමේන්තුවල වක්‍ර වියදම් යටතේ ඇති ප්‍රතිපාදන වලින් ගෙවීම සිදුකර ඇත.

මෙම ගෙවීම අයවැය වක්‍ර වියදම් ලෙස දැක්වීම කර ඇති අතර ආයතනයේ බාහිර උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලාවල එම ආදායම් ඉපදවීම සඳහා කටයුතු කරන කාර්යය මණ්ඩලවල වලට ඔවුන් විසින් සිදුකරන අමතර වැඩ කොටස් සඳහා මෙම ගෙවීම සිදුකල යුතු බවට ආයතනයේ මූල්‍ය සහ කළමනාකරන කමිටු නිර්දේශය මත ආයතනයේ කළමනාකරන මණ්ඩලය තිරණය මත සිදුකරන ලදි.

(ඇ) ආයතනය මගින් විවිධ අරමුදල් (පර්යේෂණ හා සංවර්ධන අරමුදල, ශිෂ්‍ය ආපදා අරමුදල) ආදිය පිහිටුවා ඇත්තේ 2004.04.30 දින භාණ්ඩාගාර ලේකම්තුමාගේ ලිපියේ ප්‍රතිපාදනයන්ට යටත්වයි.

විමසුමෙහි සදහන් අරමුදල සදහා පෙන්වා දී ඇති අරමුදල් මාරුකිරීමට ආයතනයේ කළමනාකරන මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඒ ඒ පාඨමාලාවල අයවැය තුල වක්‍ර වියදම් ලෙස දක්වා ඇති ප්‍රතිපදාන තුලින් සිදුකර ඇත.

(ඇ) මෙම පාඨමාලා 5 සදහා කොළඹ විශ්ව විද්‍යාල පරිගණක අධ්‍යයන ආයතන කළමනාකරන මංඩලය අනුමැතිය ලැබී ඇති අතර ඒ සදහා අනුමැතිය ලබාගැනීම සදහා වන ඉල්ලීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව වෙත යොමු කර ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ආයතනය මගින් පවත්වනු ලබන තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි පාඨමාලාවන් සදහා සුදුසුකම් සහ අත්දැකීම් ලත් දේශකවරු සති අන්තයේ රාජකාරි කටයුතු සදහා ගෙන්වා ගැනිම දිරිගැන්වීම සදහා ඔවුන් වැයකරන පෞද්ගලික ප්‍රවාහන ගාස්තු වලින් කොටසක් ප්‍රතිපූර්ණය කිරිම සදහා මෙම දීමනාව ගෙවන ලදි.

නමුත් විගණනයේදි පෙන්වා දී ඇති ඉහත අඩුපාඩුව නිවැරදිකර ගැනිමට කටයුතු කරමි.

(ආ) ආයතනය මගින් එහි කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ සෞඛ්‍ය රක්ෂණ සදහා භාහිර රක්ෂණ ආයතනයක රක්ෂණ ආවරණයක් ලබාගනිමින් පැවති අතර 2014 වර්ෂයේ මේ පිළිබදව අධ්‍යයනයෙන් පසුව ආයතනයේ මූල්‍ය කමිටුව කොළඹ විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක වන ආකාරයේ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් අභ්‍යන්තරව ක්‍රියාත්මක කළ යුතු බවට නිර්දේශ කළ අතර කළමනාකරණ මණ්ඩලය විසින් එය ක්‍රියාත්මක කල යුතු බවට තිරණය කරන ලදි.

මෙකී අරමුදල සදහා අවශ්‍යවන අරමුදල් පශ්චාත් උපාධි පාඨමාලා සහ භාහිර උපාධි පාඨමාලා අරමුදල්වලින් සහ කාර්යය මණ්ඩලවල සාමාජිකයන්ගෙන් දායකත්වයෙන් සම්පාදනය කරන ලදි. අදාල සෞඛ්‍ය රක්ෂණය සදහා පාඨමාලාවලින් ඉපයූ අරමුදල් භාවිතයට අනුමැතිය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා ලිපි අංක UGC/F/HIS මගින් ලැබී ඇත.

(ඇ) ආයතනයේ අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන සියලු කාර්යයමණ්ඩලවල පෞර්ශත්ව වර්ධනය තුලින් ආයතනයේ ඵලදායිත්වයද, ඉහල නැංවීමේ අරමුණින් සහ ඔවුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරිත්වය අභිප්‍රේරණය සදහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට ආයතනයේ සුභසාධක සංගමය හරහා සිදුකරනු ලබයි. ඒ සදහා අවශ්‍ය ප්‍රතිපාදන ආදයම් උපදවන පාඨමාලාවල අනුමත ඇස්තමේන්තුවල වක්‍ර වියදම යටතේ දක්වා ඇති ප්‍රතිපාදන තුලින් භාවිතා කරනු ලබන්නේ ආයතනයේ මූල්‍ය හා කළකමනාකරණ කමිටු නිර්දේශය මත කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියෙනි.

4.2 (අ) මෙම අරමුදලේ නිර්නායක අනුව පර්යේෂණ කාර්යන්හි නියැලෙන විශේෂ ගණයේ ප්‍රවීනතා දක්වන මහාචාර්යයවරුන් වාර්ෂිකව මෙම ආයතනයට පැමිණ වරින්වර සේවය කර ඇතත් ඔවුන් එකි සේවා සපයා ඇත්තේ මහාචාර්ය වී කේ සමරනායක මහතාට කරන උපහාරයක් වශයෙන් ස්වේච්චාවෙනි. එම නිසා මෙම අරමුදලෙන් වියදම් දරා නැත.

(ආ) කළමනාකරන මණ්ඩල ගෙවීම් මුල්‍ය කමිටු රැස්වීම් සහ විගණන කමිටු රැස්වීම් යනාදිය සඳහා ලබාදෙන අත්තිකාරම් වලින් නොපැමිණි සාමාජිකයන්ට ගෙවියයතු මුදල ආපසු පියවීම නිසා මෙම වෙනස සිදුවි ඇත. සියළු අත්තිකාරම් නිකුත් කිරිම නිසි ඇස්තමේන්තු මත පදනම්ව පමනක් සිදුකර ඇත.

## 4.3 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙලිදරව් නොකිරිම

(අ) **තීක්ෂණ** සමාගම භාවිතා කරනු ලබන භෞතික සම්පත් වෙනුවෙන් එම ආයතනය කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනයෙහි කළමණාකරණ මණ්ඩලය නියම කරනු ලැබූ කුලිය ගෙවා ඇත. **තීක්ෂණ** සමාගමේ කටයුතු පරිගණක ආයතන පරිශ්‍රය තුළ **සිදු** කළ ද ඒ පරිගණක ආයතනයේ කළමණාකරණ මණ්ඩලය **විසින්** අනුමත කුලී දීමනාව වාර්ෂිකව ගෙවා ඇත.

කොළඹ **විශ්ව විද්‍යාලයීය** පරිගණක ආයතනය සඳහාම යොමු කරන ලද සියලුම ව්‍යාපෘති කොළඹ **විශ්වවිද්‍යාලීය** පරිගණක අධ්‍යයනායතනයේ වෙත පමණක් ලබාදෙන අතර ටෙන්ඩර් **පටිපාටිය** යටතේ **තරගකාරිව** ලබාගන්නා ව්‍යාපෘති පමණක් **තීක්ෂණ** සමාගම වෙත ලබාගැනේ. ඒ අනුව පරිගණක ආයතනය වෙත ලද කිසිදු ව්‍යාපෘතියක් **තීක්ෂණ** සමාගම වෙත යොමු නොවූ බව ඉතා වගකීමෙන් ප්‍රකාශ කරමු.

(ආ) මෙම සේවකයින් දෙදෙනා කොන්ත්‍රාත් පදනම යටතේ පරිගණක අධ්‍යයන ආයතනයේ මෘදුකාංග ඉංජිනේරුවන් ලෙස සේවය කළ සේවකයින් දෙදෙනෙකි. නමුත් පරිගණක ආයතනය රජයේ ආයතනයක් බැවින් මෘදුකාංග ඉංජිනේරු තනතුර හෝ එහි වැටුප් තල හෝ සකසා නොතිබින. මෙවැනි වාතාවරණයක් තුළ ඔවුන් කොළඹ **විශ්වවිද්‍යාලිය** පරිගණක ආයතනයෙන් ඉල්ලූ වැටුප් හා පාරිශ්‍රමිකයන් ලබාදීමට නොහැකිවූයෙන් ඔවුන් ඉල්ලා අස්විය. ඉන්පසුව **තීක්ෂණ** සමාගම **විසින්** ඔවුන්ගේ ප්‍රතිපාදන මත මෙම පුද්ගලයින් දෙදෙනා සේවයට බඳවා ගෙන ඇත.

(ඇ) කොළඹ **විශ්වවිද්‍යාලිය** පරිගණක අධ්‍යයන ආයතනය උසස් අධ්‍යාපන ආයතනයක් වන අතර එහි මූලික අරමුණ වනුයේ **උපාධි** පාඨමාලා සහ අභිඥාන හා සහතික පත්‍ර පාඨමාලා පවත්වා ගෙන යාමයි. **තීක්ෂණ** සමාගමේ මූලික අරමුණ ජාතික හා ජාත්‍යන්තර අවශ්‍යතාවන් මත මෘදුකාංග නිපදවිම හා සංවර්ධනය කිරීම වේ. එබැවින් පරිගණක **අධ්‍යයන** ආයතනය හා **තීක්ෂණ** සමාගම යන ආයතනය දෙකෙහි අරමුණ කිසිසේත් එක හා සමාන නොවන බව තරයේ ප්‍රකාශ කර සිටිමු. එමනිසා **තීක්ෂණ** සමාගම කිසිසේත් පරිගණක ආයතනයතට **තරගකාරි** ආයතනයක් නොවේ.

(ඈ) පරිගණක ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයා මෙම කටයුත්ත කරනු ලැබුයේ ස්වකීය කාර්යාල රාජකාරියෙන් පරිබාහිරව වන අතර එය ඔහුගේ නිල රාජකාරියේ කටයුත්තක් නොවේ. ඔහුගේ වෘත්තීය දැනුම සාමාන්‍ය රාජකාරී වේලාවෙන් බැහැරව අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය මත ඉටුකරන ලද කාර්යක් වන අතර **එමගින්** කොළඹ **විශ්වවිද්‍යාලයිය** පරිගණක ආයතනයේ රාජකාරීවලට කිසි බාධාවක් හෝ බලපෑමක් **සිදුවී** නැත.

(ඉ) **තීක්ෂන** ආයතනය කොළඹ **විශ්ව විද්‍යාලිය** පරිගණක අධ්‍යයනායතනයේ කළමණාකරණ මණ්ඩලයේ අනුදැනුම ඇතිව සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද **ඇපයෙන් සීමිත** සමාගමකි. මෙහි සාමාජිකයින් කොළඹ **විශ්ව විද්‍යාලයීය** පරිගණක අධ්‍යයනායතනයෙහි ස්ථිර කාර්ය මණ්ඩලය වන අතර රු.100.00 බැගින් ගෙවා සාමාජිකත්වය ලබා ගෙන ඇත. කොළඹ **විශ්වවිද්‍යාලීය** පරිගණක අධ්‍යයනායතනයේ නියමාවලිය යටතේ සමාගමක් පිහිටුවීමට ඍජු නෛතික බලයක් ලැබී නැත. තීරණයක් ගැනීම පිණිස **තීක්ෂණ** සමාගමේ අධ්‍ය**ක්ෂක** මණ්ඩලය වෙත **විගණකාධිපතිතුමා විසින් විමසන** ලද කරුණ කොළඹ **විශ්වවිද්‍යාලීය** පරිගණක අධ්‍යයනායතනයෙහි කළමණාකරන මණ්ඩලය හරහා දැනුම් දීමට ක්‍රියාකරමි.

(ඊ) **තීක්ෂණ** සමාගම පිහිටුවීම තුළින් බලාපොරොත්තුවූයේ ජාතික හා ජාත්‍යන්තර මෘදුකාංග අවශ්‍යතාවයන් ඉටුකරමින් සේවාවක් ලබාදීමයි. නිදසුනක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත සකස් කර දුන් දැනට දිවයින පුරා ක්‍රියාත්මක ඇඟිලි සළකුණු හඳුනා ගැනීමේ මෘදුකාංගය, **විශ්වවිද්‍යාල** ප්‍රතිපාදන කොමිෂන් සභාවට ලබා දුන් ශිෂ්‍ය ප්‍රවේශ මෘදුකාංශය, රෙජිස්ටාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවට ලබා දුන් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ මෘදුකාංගය සහ ශ්‍රේෂ්ඨාධිකරණයට ලබා දුන් මූලික අයිතිවාසිකම් නඩු ගොණු කිරීමේ මෘදුකාංගය මෙම සේවාවන් **තීක්ෂණ** සමාගම රජයට ලබා දුන්නේ ලාභ පරමාර්ථයෙන් නොව ජාතික අවශ්‍යතාවය සළකා ගෙනයි. **තීක්ෂන සමාගම පිහිටුවා ඇත්තේ ලාභ පරමාර්ථ නොවන ආයතනයක් ලෙසයි.** කෙසේ නමුත් මෙම විගණන විමසුම කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයෙහි කළමණාකරන මණ්ඩලය හරහා **තීක්ෂණ** ආයතනයේ අධ්‍යයන මණ්ඩලයට යොමු කරමි.

**4.4** අදාල ව්‍යාපෘති සාර්ථකව නිමකර ඉතිරිවූ මුදල සහ එකී අරමුදල්වල ආයෝජන ආදායමෙන් **මෙම ශේෂයයන් සමන්විත වී ඇත.** අදාල ව්‍යාපෘති සාර්ථකව නිමකර විගණන කටයුතුද අවසන් කර ඇත. එහෙත් අදාල අරමුදල් සැපයූ ආයතන එම මුදල්වල පිළිබඳව ඔවුන්ගේ නිර්දේශයන් මෙතෙක් ඉදිරිපත් කර නොමැත. එම නිසා තාවකාලිකව එම අරමුදල් සුරක්ෂිතතාවය සඳහා ආයතනයේ පර්යේෂන හා සංවර්ධන අරමුදලට මාරුකල යුතු බවට කළමනාකරණ මණ්ඩලය තීරණය කරන ලදි.

මෙම ගිනුමේ ශෙෂයන් පැවතියේ ඒ සඳහා ආරම්භකල දේශිය විදේශිය මුදල් ගිනුම්වල (RFC Accounts) US $ වලිනි සහ US $ ස්ථාවර තැන්පතුවලය.

සිටු අංක 6

## 4.5 කාර්යය මණ්ඩල පරිපාලනය

කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයනායතනයේ සේවයට බඳවා ගැනීම සඳහා පූර්ව පුහුණුව ලැබූ කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වන හෙයින් ආරම්භක අවස්ථාවේදී පුහුණු පදනම මත අධ්‍යයන සහායක සහ අනධ්‍යයන තනතුරුවලට ගැළපෙන පරිදි බඳවා ගනු ලැබූ කාර්ය මණ්ඩලය දැනට සේවයේ යෙදී සිටින අතර මේ වන විට Zero base පදනම මත මෙම ආයතනයට අවශ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඇගයීම සහ විමර්ශනය සිදු කරන හෙයින් එම කාර්ය අවසන් වූ පසුව දැනට සිටින කාර්ය මණ්ඩලය ස්ථිර සේවයට බඳවා ගැනේ.

## 5. ගිනුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5. 1 අභ්‍යන්තර විගණනය

අප ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු කොළඹ විශ්වවිද්‍යාල අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකිරිම අප ආයතනයේ කිසිදු විරෝධයක් නොමැති බව අප විසින් කොළඹ විශ්ව විද්‍යාලය වෙත ලිඛිතව දැනුම් දී ඇත. නමුත් මෑත වර්ෂ කිහිපය තුල එම අංශය මගින් අප ආයතනයේ සේවක වැටුප් ගෙවිම, කොන්ත්‍රාත් සඳහා ගෙවිම, විශ්වවිද්‍යාලිය අර්ථසාධක අරමුදල් නිදහස් කිරිම ආදියේ පූර්ව විගණන පමනක් සිදුකරනු ලැබුයේ එම අංශය සතු සිමිත කාර්යය මණ්ඩලයට ආවර්ණය කිරිමට ඇති වැඩ ප්‍රමාණය නිසා බව විගණන කමිටුවේදි ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකතුමා දැනුම් දෙන ලදි.

අප ආයතනය මගින් මෙහෙයවන භාහිර උපාධි පාඨමාලාව වැනි වැඩසටහන් වල දිවයින පුරා සිදුවන ගණුදෙනු වල ස්වාධින පරික්ෂණයක් සිදු කළ යුතු බවට ආයතනයේ කළමනාකරන මණ්ඩලය තීර්ණය කරන ලදි.

ආරම්භයේ සිටම මෙම අභ්‍යන්තර විගණනය නිසා ආයතනයේ දියුණුවට ඉමහත් පිටුවහලක් ලැබූ අතර ඒ සඳහා දරණ වියදම එයින් ලැබෙන ප්‍රතිලාබයට වඩා බෙහෙවින් අඩු බව කළමනාකරණ මණ්ඩලය තීරණය කරන ලදි.

## 6. පද්ධති හා පාලන

### (අ) ස්ථිර වත්කම් පාලනය

මෙම ආයතනයේ තිබෙන වත්කම් ලේඛන ගත කොට ඇත. දැනට භාවිතයේ තිබෙන පොත් අගය අනුව ක්ෂයවී අවසන්වූ භාණ්ඩ නැවත අගය කිරීම (Revaluation) පිණිස කමිටු පත්කර ඇත. ඒ අනුව දැනට භාවිතයට ගන්නා 2016-12-31 දිනට පොත් වටිනාකම අනුව ක්ෂය වූ වත්කම් නැවත ඇගයීම් කර පොත්වලට ගැනීම 2017-01-15 දිවට පෙර අවසන් කෙරේ. මෙම කටයුතු අවසන් වීමෙන් පසුව මෙම ගැටළුව විසදෙනු ඇත.

(ආ) සටහන් කර ගතිමි.

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් Zero base පදනම මත කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයනායතනයේ සේවක සංඛ්‍යාව පිළිබඳව ඇගයීම සිදු කරමින් පවතින හෙයින් එහි අනුමැතිය ලැබුණු පසුව පුරප්පාඩු පිරවීම සිදුකෙරේ. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දෙන තෙක් මෙම කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත.

(ඇ) සටහන් කර ගතිමි.

මෙයට
විශ්වාසී

මහාචාර්ය කේ. පී. හේවාගමගේ
අධ්‍යක්ෂක

*පිටපත්:* 1. ලේකම්, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව
4. උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය
5. විගණන අධිකාරී -කොළඹ විශ්වවිද්‍යාලීය ශාඛාව